# සැලසුම් කිරීම හා වැඩ සටහන් සකස් කිරීම

ඩබ්ලිව්. ගුණසේගරම්

මහවැලි සංවර්ධන මණ්ඩලය

මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනම් කිරීම යනුවෙන් කුමක් අදහස් වේද?

මුදල් යෙදවීමේ හා ඉදිකිරීමේ වැඩ සටහන් ආදිය අනුපිළිවෙලින් ක්‍රියාත්මක නොකොට, ව්‍යාපාරය හා අදාල වූ ප්‍රධාන යෝජනා ක්‍රම සමකාලීනව ක්‍රියාත්මක කරවීම සඳහා රජය විසින් ගන්නා ලද තීරණය මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනම් කිරීම යනුවෙන් අදහස් වේ. මේ සඳහා මිනිසුන්, මුදල්, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය ආදී වූ සම්පත් රාශියක් සංකේන්ද්‍රණය කර කෙටි කාලසීමාවක් ඇතුලත ප්‍රයෝජනය සඳහා ලබාගැනීමට සැලසිය යුතුය. වැඩ අවශ්‍යතා සහ මෙසා මහත් කාර්ය සංකීර්ණයේ කළමනාකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා සම්පත් තත්ත්වය ප්‍රමාණවත් විය යුතුය.

## මුදල් යෙදවුම.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ඔවුන්ගේ ආධාර හා මුදල් යෙදවුම් ආයෝජනය කිරීම සඳහා යෝග්‍යවූවක් බව ජනාධිපතිවරයා, වාරිමාර්ග හා මහාමාර්ග ඇමතිවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිවරයා විසින් අප ජාතියට, ලෝක බැංකුවට හා සංවර්ධිත රටවලටද ඒත්තු ගන්වා ඇත. රුපියල් කෝටි 1200 ක ආධාර ලබාගැනීම පිළිබඳව සැක පහළ කළ බොහෝ අය සිටින නමුත් එහි සාවද්‍යතාවය දැනටමත් ඔප්පු වී ඇත.

මුදල්, කෘෂි-ප්‍රතිලාභ, සමාජීය ප්‍රතිලාභ, රැකියා නියුක්ති ප්‍රතිලාභ, ජල ඉල්ලුම හා සැපයුම, මිල ප්‍රතිලාභ යනාදී මූලික පරාමිති සලකාබැලීමෙන් ඉදිකිරීමේ අනුපිළිවෙල විභාග කළ හැක. නියමුකාල අන්‍යොන්‍ය රැඳී පැවැත්මෙන් යුතුය; සංකීර්ණය. කොටින්ම, මුදල් යෙදවුම හා සම්පත් ලබාගත හැකිබව පිළිබඳ නියමු කාලයන් කොතරම් විචල්‍යය ද හා දැනට ශ්‍රී ලංකාණ්ඩුවේ පාලනයෙන් කොතරම් පිටස්තර ද කිවහොත් මාගේ මතය අනුව, අනුක්‍රමණය කිරීම, යුක්ති ප්‍රතිපාදනය කිරීම නිෂ්ඵල වනු ඇත. කොත්මලේ වික්ටෝරියා, රන්දෙනිගල හා මොරගහකන්ද බඳුවූ ප්‍රධාන ජලාශ ඉදිකිරීම අනුක්‍රමණය කිරීම මුදල් යෙදවුම් අනුක්‍රමණය කිරීම හා අනනුකූල වනු ඇත.

මිනිපේ දකුණු ඉවුරු ඇළ, උල්හිටිය ජලාශය, මාදුරු ඔය, මිනිපේ හා කන්දෙකාඩු අමුණු හා ඒ, බී, සී, යන වාරි කර්මාන්ත කලාප ආදිය ඉදිකිරීම, ප්‍රධාන ඉදිකිරීම් කටයුතු නිමකිරීම අනුක්‍රමණය කිරීමට පසුව කළ යුතුය. දයක රටවල වැඩ සටහන් ක්‍රියාත්මක කරවීමෙන් පසුව හා ඔවුන්ගේ කොන්ත්‍රාත්කරුවන් පැමිණියාට පසුව මීළඟ මාස කිහිපය ඇතුලත අනුක්‍රම පිළිවෙල පැහැදිලි විය යුතුය.

## ඉදිකිරීම.

මෙරට යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය හා කළමනාකරණ යනාදී වූ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සම්පත්වලින් එකද ක්ෂේත්‍රයකවත් සය අවුරුදු කාලසීමාවක අවශ්‍යතා සපුරාලිය නොහේ. දයක රටවල් විසින් ජාතික කොන්ත්‍රාත්කරුවන් ලවා ඔවුන්ගේම සම්පත් යෙදවීමට සැලැස්වීමෙන් මෙම බාධක මඟහරවා ගෙන ඇත.

ප්‍රධාන ඉදිකිරීම් වැඩ පහත දක්වා ඇති අන්දමට සංක්ෂිප්තව දක්විය හැක:—

1. වේලි, ජලාශ හා මහා වැඩ - වඩා යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන්
2. බල මධ්‍යස්ථාන
3. වාරි කර්මාන්ත පද්ධතීන් - වඩා ශ්‍රමය භාවිතයෙන්

මෙයින් මුලින් සඳහන් කටයුතු විදේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් ඉටුකරනු ලැබිය යුතුය. වාරි කර්මාන්ත කටයුතු, දේශීය තත්ත්වයන් ගැන වඩා හොඳින් දන්නා ශ්‍රී ලාංකිකයන් විසින් ඉටුකරනු ලැබීම වඩා උචිතය.

## වාරි කර්මාන්ත අධෝ ව්‍යුහය.

වාරි කර්මාන්ත පද්ධතියේ සැලැස්ම හා එය ඉදිකිරීම, ජල ශක්ති හා ඉංජිනේරු අවශ්‍යතාවයන් සමඟ පමණක් නොව බෝග ඉල්ලුම, වගා රටාවන්, ජල පරිමාව හා වගා කිරීමේ කාල පරිච්ඡේදයන් සමඟද අනුකූල විය යුතුය.

## ගොවීන් පදිංචි කරවීම.

ජනාවාසීන් තෝරාගැනීම, ඔවුන් පදිංචි කරවනු ලබන ප්‍රදේශවල වගාකළ හැකි බෝගවලට අනුහුරුවීම ඔවුන්ගේ යෝග්‍යතාවය මත රඳා පවතිනු ඇත.

කෙසේ වුවත්, ගොවි කණ්ඩායම්වලට මාරුවෙන් මාරුවට ජලසම්පාදනය කිරීමේ ක්‍රමය පිළිබඳව පුහුණුවක් ලබාදීම සඳහා ගොවි අභ්‍යාස වැඩසටහන් පැවැත්වීමට නියමිතය. විශේෂ වගාවන් සඳහා නියමකර ඇති ඉඩම්වල ජනාවාසීන් පදිංචි කරවීමට මත්තෙන්, ඔවුන්ට හුරු පුරුදු නැති බෝග වගාකිරීම පිළිබඳව පුහුණුවක් ලබාදීමට යෝජනා කර ඇත.

## කෘෂිකර්මාන්තය.

ලබාගත හැකි ජල සම්පතෙහි ප්‍රශස්ත උපයෝගිතාවය, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ වැදගත් අංගයකි. ව්‍යාපාරය නිර්මාණය කර ඇත්තේද, යෝග්‍ය පසෙහි (දිය ගැල්වීමේ පරිමාණය අඩු) වී හා සාම්ප්‍රදායික ලෙස ලියදි පිරවීමෙන් වී වගාකිරීමේ ක්‍රමයට වඩා අඩු ප්‍රමාණයක් ජලය අවශ්‍ය වෙනත් බෝගද සංකලනය වූ වැව්ලි ක්‍රමයක් සඳහාය.

ඕනෑම පස් වර්ගයක සියළුම කන්නවලදී ලියදි පිරවීමේ ක්‍රමයට වී වගාකිරීමේ පුරුද්දෙන් ගොවීන් මෑත් කරවීමේ ප්‍රශ්නය තවමත් සාර්ථකව විසඳිය යුතුව ඇත. යල කන්නයේදී ලියදි පිරවීමේ ක්‍රමය අනුව සීමිත වී වගාව සහිතව කලින් නියම කළ ජල පරිමාවක් මත ජලය සැපයීම සඳහා ජලාශ ධාරිතාවයන් හා ඇල මාර්ග පද්ධතීන්ද සැලසුම්කර ඇති බැවින් මෙම ප්‍රශ්නය විසඳිය යුතුව ඇත.

**ප්‍රජා සංවර්ධනය (හා සමාජීය අධො ව්‍යුහය).**

ප්‍රජා සංවර්ධනය කෘෂිකර්මාන්තය හා ගොවීන් පදිංචිකරවීම අභිබවා සිටියද, එකී කාර්යයන් දෙකම ප්‍රජා සංවර්ධනයෙහි අන්තර්ගත වේ. මාර්ග, ප්‍රවාහණය, නිවාස, පණිවුඩ හුවමාරු ක්‍රම, සැපයුම් හා කෘෂිකර්මාන්තය, අලෙවිය හා බෙදහැරීම සඳහා අවශ්‍ය යෙදවුම් හා සේවා සැපයුම් සැලසුම්කිරීම බොහෝ කල් වේලා ඇතිව ආරම්භ කළ යුතුය. මෙම කාර්ය සැලසුම් කිරීම හා එය කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කර තිබීමද, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් කළ යුතු බව පැහැදිලි කරුණකි.

ප්‍රජා සංවර්ධනය හා සමාජීය අධො ව්‍යුහය සියලු කාර්ය හා සම්බන්ධවූ, වාරි කර්මාන්ත පද්ධතීන්හි මුල් අවධීන් හා කෙලින්ම බැඳී පවත්නා කටයුත්තක් ලෙස මා දක්වූයේද මේ නිසාය. ('ප්‍රධාන කටයුතු' බලන්න).

**වැඩසටහන් පිළියෙල කිරීම, වාර්තා කිරීම හා අගැයුම් කිරීම.**

තාත්වික ඉලක්ක දින නියම කරගැනීමේ අදහසින් ඓතිහාසික මෙන්ම තථ්‍ය දත්තයන් අනුසාරයෙන් වැඩසටහන් සකස්කිරීම ප්‍රවර්ධනය කොට ඇත. සෑම ප්‍රධාන කටයුත්තක්ම සඳහා ජාලයක් සකස්කරන ලදුව, ඒවායේ අන්තර් සම්බන්ධතා හා අන්‍යොන්‍ය රැඳියාවන්ද සකස්කර ඇත. වාරිමාර්ග පද්ධතීන් ඉදිකිරීම, ජනාවාස කෘෂිකර්මාන්තය හා සංවර්ධනය ආදී කටයුතු සමායෝජනය කරනු ලබන්නේ මහවැලි සංවර්ධන මණ්ඩලය මගිනි.

**වාර්තා කිරීම.**

දෘශ්‍යමාන වාර්තා කිරීම් ක්‍රමයක් සකස් කොට ඇති අතර මහවැලි සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන්ට හා අනිකුත් අයටද, පිටස්තර පුද්ගලයන්ටද මෙම ක්‍රමය අනුව කාර්ය ප්‍රගතිය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට පහසුවීම දිරිගන්වන සුළු කරුණකි. සාමාන්‍ය අන්දමට සංඛ්‍යා භාවිතයෙන් මෙම නිරූපනය පරිපූර්ණ කෙරේ.

**ඇගයුම් කිරීම.**

මේවනවිටත් සංවර්ධනය කරනු ලබන 'එච්' කලාපයේ හා කඩිනම් වැඩසටහනෙහිද ප්‍රගතිය පිළිබඳ සරල ඇගයුමක් දැනට කරනු ලැබේ. සංවර්ධිත ප්‍රදේශවල ප්‍රතිලාභ ඇගයුම් කිරීමේ අදහසින් හා අරමුණු ආශ්‍රයෙන් ප්‍රතිඵල සමාලෝචනය කිරීමද උදෙසා ක්‍රම සම්පාදන හා ඇගයුම් අංශය ව්‍යාප්ති කරනු ලැබේ. ප්‍රවීන දේශීය හා විදේශීය විශේෂ උපදේශකවරු මෙම විචක්ෂණක සංවර්ධන ව්‍යායාමය සැලසුම් කිරීමෙහි නියුතුව සිටිති. මෙම කාර්යය හා සම්බන්ධ සෑම පුද්ගලයෙකුම මුළු ලොව පුරා විස්තීරණව ඇති මෙම කටයුතු දමයෙහි එක් කුඩා පුරුකක් පමණක් වන බව නොකිවමනාය.

1 වන පරිශිෂ්ටය

# යෝජනා ක්‍රමයේ කාර්යාවලින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

——— කාලය ———>

**දේශපාලනමය හා ආර්ථික ප්‍රාර්ථනා**

දේශපාලනමය හැඟීම්, ආර්ථික හා සාමාජීක බලපෑම්

**සාධ්‍යතා අධ්‍යයන**

මහා සැලැස්ම (යූඑන්ඩීපී/එෆ් ඒ ඕ දත්ත, යෙදවුම් – නිපැයුම් වල විශ්වාසනීයත්වය, පිරිවැය, ආපහු ලැබීම්)

**මූළ ආර්ථික හා මුදල්මය සැලසුම් කිරීම**

(අයවැය, රැකියා නියුක්තිය, සමාජීය ප්‍රතිලාභ ආදිය)

**තෝරාගත් යෝජනා ක්‍රම අධ්‍යයනය**

**මුදල් යෙදවුම්** (දේශීය හා විදේශීය)

**ඉදිකිරීම** (දේශීය හා විදේශීය ඒජන්සි)

**ජනාවාස**


**කෘෂිකර්මය හා**

**විදුලිය ජනනය**

**සංවර්ධනය**

**ප්‍රතිලාභ ඇගයුම**


# 2 වන පරිශිෂ්ටය




2 වන පරිශිෂ්ටය– ප්‍රධාන කාර්යයන්

## 3 වන පරිශිෂ්ටය

# 1977-1983



# පදිංචිකරවීමේ මුල් අවධියේ මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ජනාවාස ප්‍රතිපත්තියේ මුහුණුවර කීපයක්*

**ඩිංගි කරුණාතිලක**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ මණ්ඩපය**

මහවැලි සංවර්ධන ව්‍යාපාරය වසර පහක හෝ හයක කාලයකින් නිමකරනු ලැබූවිට, මහවැලි ගඟ හා එහි අතු ගංගාවල ජලයෙන් මහවැලි හා මදුරුඔය ද්‍රෝණිවල හා උතුරුමැද පළාතේ ඉඩම් අක්කර 900,000 කට පමණ වාරිමාර්ග පහසුකම් සැලසෙනු ඇත. මෙම ඉඩම් වලින් අක්කර 246,000 කට පමණ දැනටමත් ජලය සපයනු ලබන අතර අවුරුද්දකට නොකඩවා කන්න දෙකක් වගා කළ හැකි වන පරිදි මේවාට පරිපූරක ජල සැපයුම් ලබාදෙනු ලැබේ. ඉතිරි අක්කර 654,000 ක් පමණ වූ ප්‍රදේශය දැනට කැලෑ ප්‍රදේශයට අයත් වේ. ව්‍යාපාරය සම්පූර්ණ කළාට පසුව, මෙම නව ඉඩම්වල ගොවි පවුල් 225,000 ක් පදිංචි කරවීමට අපේක්ෂා කරනු ලැබේ.

උතුරු මැද පළාතේ යෝජනා ක්‍රම සැලසුම් අනුව 1975 වනවිට පවුල් 2187 ක් පදිංචි කරවීමට අපේක්ෂා කරන ලදී. වැඩ සටහන යටතේ 1976 දී පවුල් 7342 ක්ද, 1977 දී පවුල් 6381 ක්ද, 1978 දී පවුල් 11,220 ක්ද වශයෙන් පවුල් 27,113 ක් පදිංචි කළ යුතු වුවද, ඉදිකිරීමේ වැඩ හා ජනාවාස වැඩ සටහන්ගත කිරීමේදී සිදුවූ නොයෙකුත් ප්‍රමාද හේතුකොටගෙන 1976 වන විටත් දක්නට ලැබුනේ මුලින්ම පදිංචිකරවූ පවුල් 2187 කින් යුතු පළමු කණ්ඩායම පමණි. මෑතකදී දෙවන පවුල් කණ්ඩායමද පදිංචිකරවනු ලැබූ බව වාර්තා කර ඇත.

ජනාවාස ප්‍රතිපත්තිය හා වැඩසටහන්ද එකල නිල මට්ට මෙහිදී දැඩි සාකච්ඡාවට භාජනය වූ බව පෙනී යයි. ආධාරක සේවා, නායකත්ව රටාවන්, වෙන්කර දීමේ ඒකක හා ආධාර, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම්, බඳවාගැනීම හා තෝරාගැනීම බඳුවූ සමාජ විද්‍යාත්මක ප්‍රශ්න ගණනාවක්ම සවිස්තර සාකච්ඡාවට භාජනය කෙරුණු සාධ්‍යතා වාර්තාවක්ද විය. මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් නියාදෝ ගම් සමූහයක්, වගාවට සමීපත්වය, ඒකාබද්ධ සේවා මධ්‍යස්ථාන ආදීවූ ද අවධාරණය කළ ඉතා දියුණු වූ ජනාවාස සැලැස්මක් සකස්කර ගන්නා ලදී. එසේවුවද, එහි ප්‍රතිඵලයක් ලෙස වසර ගණනාවක් තිස්සේ සංවර්ධනය වූ ඉඩම් සංවර්ධන ප්‍රතිපත්තීන් ඉවතලූ බවක් පෙනීයයි. බඳවා ගැනීම්, ආධාර ආදී කරුණු සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තීන් සම්පාදනය කරනු ලැබීය.

ජනාවාස වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය යථාර්ථය මගින් විමසුමට ලක්වන අයුරු කාලයාගේ ඇවෑමෙන් දැකගත හැක. ආරම්භක අවදියේදී වුවද, නව ප්‍රතිපත්තීන් හේතුකොට ගෙන ජනාවාසීන්ට නොයෙක් දුක් කම්කටොළුවලට මුහුණ පෑමට සිදුවූ අතර, නව ග්‍රාමීය ජනාවාස වැඩ සටහන අනුව ජීවත් වීමට සිදුවූ පුද්ගලයන් කෙරෙහි ප්‍රතිපත්ති නිර්මාපකයන් තුළ අනුකම්පා මාත්‍රයක් තිබුණි නම් එබඳු දුක් ගැහැට බොහොමයක් මඟහරවා ගැනීමට ඉඩ තිබිණි.

ජනාවාසයන්හි ආරම්භක අවධිය, ප්‍රතිපත්ති නිර්මාපකයන් සිතන තරම් නොවැදගත් වූවක් නොවේ. වාරිමාර්ග පද්ධතිය ක්‍රියාත්මක වීමට හා මෙම ගොවි පවුල්වලට ඔවුන්ගේ පහත්බිම් අක්කර $2\frac{1}{2}$ හා ගොවිපළ සඳහා අක්කර $\frac{1}{2}$ ක ඉඩමෙන් ප්‍රවර්ධිත ගොවිතැන හා ආයෝජනයෙහි හැම මට්ටමක් සඳහා මුල පිරීමට නම්, ආයෝජන පටන්ගැන්ම සඳහා මූලාරම්භයේදීම වඩාත් උසස් මට්ටමක පහසුකම් සැලසිය යුතුය. අඩුවශයෙන්, ආරම්භක අවදියෙහිදී ඔවුන්ගේ සෞඛ්‍යයට බාධා නොපැමිණෙන අයුරින් අවම සෞඛ්‍යය හා අනිකුත් පහසුකම් සැලසිය යුතුව තිබිණ.

පවුල් 2187 කින් යුතු මුල් ජනාවාස කණ්ඩායමේ අත්දැකීම් විශේෂ වැදගත්කමකින් යුක්තවනුයේ ගොවි පවුල් 225,000 කට පදිංචිවීමට හා ඔවුන්ගේ නව අනාගතයට පිවිසීමට වාරය පැමිණි විට, ඔවුන්ටද ඊට මුහුණදීමට සිදුවන බැවිනි. මහවැලි යෝජනා ක්‍රම සියල්ලම ඉදිරි අවුරුදු පහ හෝ හය ඇතුළත නිමකිරීමට නියමිත බැවින් ඉදිකිරීම් වැඩ නිමකරනු ලබන විට ජනාවාසීන් වැඩිදෙනෙකු මෙම අදියරෙහි පසුවනු ඇත.

**ක්ෂේත්‍ර සමීක්ෂණයේ සොයාගැනීම්:—**

1976 මැයි මස කලාවැවේ වම් ඉවුරේ එච් 1 කලාපයෙහි ක්ෂේත්‍ර සමීක්ෂණය පැවැත්විණි. නියැදි රාමුව වූයේ ඉඩම් වෙන්කර දෙනු ලැබූ ජනාවාසීන් 2013 ක් පමණ උපලේඛණගතකළ වෙන් කරදීමේ ලැයිස්තුය. කැටිසතරවලට බෙදීමෙන් පසු සසම්භාව්‍ය පදනමක් මත නියැදි තෝරාගන්නා ලදී. සම්මුඛ පරීක්ෂණ මට්ට මේදී ලැයිස්තුවල සඳහන් ඇතැම් ජනාවාසීන් මුණගැසීමට නොහැකිවූ අවස්ථාවලදී, යාබද කට්ටිවල ජනාවාසීන් සම්මුඛ පරීක්ෂණයට ලක්කිරීමෙන් යම් පමණක ආදේශ කිරීමක් සිදුවී ඇත. සම්මුඛ පරීක්ෂණයට ලක්වූ නියැදිය ජනාවාස පවුල්වලින් සියයට 3.5 කින්පමණ සමන්විත විය.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ උතුරුමැද පළාතේ කලාවැවේ වම් ඉවුරේ ව්‍යාප්ති ඇල මාර්ගය (මහවැලි ව්‍යාපාර සිතියම්වල එච් 1 කලාපය ලෙස සටහන් කර ඇත) මගින් ජල සම්පාදනය කරනු ලබන හා ඒ යටතේ ඇති නව ජනාවාස සහිත අක්කර 6000 ක පමණ මුල් සංවර්ධන ප්‍රදේශය සමීක්ෂණයට භාජනය කරන ලදී. යෝජනා ක්‍රම ලිපිගොනු අනුව සෑම පවුල කටම පහත්බිම් අක්කර $2\frac{1}{2}$ බැගින් පවුල් 2197 කට ඉඩම් වෙන්කර දෙනු ලැබූවද, ඉඩම් භාරගෙන ඇත්තේ පවුල් 1900 ක් පමණි. යෝජනාක්‍රම සැලසුම් අනුව ගොවිපළ සඳහා වෙන්කර දීමට අපේක්ෂිත අතිරේක අක්කර භාගයක බිම් කොටස මායිම් ලකුණු කිරීම හෝ කට්ටිකිරීම හෝ සිදුකර නැත.

මෙම ප්‍රදේශයෙන් සියයට දහයක් පමණ (අක්කර 600 ක් පමණ) පුරාණ ගම්වලින්ද ඉතිරිය රජයේ කැලෑවලින්ද සමන්විත වේ. පුරාණ ගම් පිහිටි ඉඩම් යෝජනාක්‍රමයට පවරාගන්නා ලදුව යළි වෙන්කර දෙනු ලබන අතර, අවශ්‍යයෙන්ම කලින් තමන් සතුව තිබි ඉඩම් මුල් අයිතිකරුවන්ට නොලැබෙනු ඇත.

පහත්බිම් ලෙස ලකුණු කර ඇති කැලෑ ඉඩම් යෝජනා ක්‍රමය මගින් එළිකර ඇත. කුඩා ව්‍යාප්ති ඇලමාර්ග හා කුඹුරුවලට ජලය නිකුත් කරන අපමුඛයන්හි ඉදිකිරීම් කටයුතු කරගෙන යනු

---

* ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ මෙහෙයවීමෙන් 1978 අගෝස්තු මස 05 දින පවත්වන ලද 'මහවැලි' සැසිවාරයේදී ඉදිරිපත් කළ ලිපියක් පදනම් කර ඇත.

දක්නා ලදී. ක්‍රියාත්මක කරවිය හැකි බුල්ඩෝසර හා ට්‍රැක්ටර් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබාගත නොහැකි වූ බැවින් යෝජනාක්‍රම නියමිත කාලවේලාවන්ට වඩා ප්‍රමාදවීම් සිදුවූ බව වාර්තාකර ඇත. ඉදිකිරීම් වැඩ බොහොමයක්ම පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් ඉටු කරනු ලැබේ.

කුඹුරුවලට ඒ වනතෙක් ජලය සැපයීම ආරම්භ කර නොතිබිණ. සමීක්ෂණය පැවැත්වූ කාලයේදී ජනාවාසීහු යෝජනා ක්‍රමය යටතේ එළිකිරීම් ආදියෙන් ශේෂව පැවති ගස්මුල් හා ගොඩැලි ඉවත්කිරීම හා ජලය නිකුත්කළ විට රැස්කර ගැනීම සඳහා නියර ඉදිකිරීම ආදී කටයුතුවල යෙදෙමින්, ජල සම්පාදනය සඳහා පහත්බිම් සූදානම් කිරීමෙහි යෙදී සිටියහ.

ජනාවාසීහු ඉඩම් කට්ටිවල තාවකාලික පැල්පත් ඉදිකර තිබී අතර ඇතැම්හු සිය පවුල්ද සමඟ මෙම පැල්පත්වල වාසය කළහ. මෙම ජනාවාසීන්ගෙන් පවුල් 250 ක් පමණ මාතලේ දිස්ත්‍රික්කයේ බෝවතැන්න ජලාශය ඉදිකිරීමේ හේතුවෙන් විස්ථාපනය වූ අය වෙති.

සමීක්ෂණය පැවැත්වූ අවදියේදී ජනාවාසීන්ට දෙවිධවූ මූල්‍යාධාර, යෝජනාක්‍රමය යටතේ ලැබී ඇත. පැල්පත් ඉදිකර ගැනීම සඳහා රු. 100/- ක් හා මාස පහක කාලයක් වනතෙක් මසකට රු. 50/- බැගින් රු. 250/- ක යැපීම් දීමනාවක් ගෙවන ලද අතර ඇතැම් කට්ටිකරුවන්ට මෙම මුදල එක්වර ගෙවා ඇත. නියර තනා නිමකළ පසු ඒ සඳහා වැය කළ වියදම් වශයෙන් තවත් රු. 750/- ක මුදලක් ගෙවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ලෝක ආධාර වැඩසටහන යටතේ සිවු දෙනෙකුගෙන් යුතු පවුලකට සලාක නිකුත්කිරීමේ පදනම මත, වියළි කිරි, පිටි, සීනි, හා ඇතැම්විට පරිප්පු ආදී ද්‍රව්‍ය සලාකයක් වශයෙන් අවුරුද්දක කාලයක් සපයනු ලැබේ. මෙම ආහාර ද්‍රව්‍ය කිහිප වතාවක්ම ලැබුණද ඒවා නිතිපතා ලැබී නැත. ජලාශය ඉදිකිරීම හේතු කොට ගෙන විස්ථාපනය වූ අයට ඔවුන් සතු භාණ්ඩ යෝජනාක්‍රම ප්‍රදේශයට ගෙන ඒම සඳහා ප්‍රවාහණ පහසුකම් සලසා ඇත.

ඉඩම් අහිමිවීම හෝ විස්ථාපනය හෝ සඳහා ජනාවාසීන්ට කිසිදු වන්දි මුදලක් ගෙවා නැත. මේ කාලය වනවිට මෙම ප්‍රදේශයේ නොකඩවා කන්න පහක්ම දැඩි නියඟය පැවති බවට වාර්තාවී ඇති අතර, එබැවින් හේන් ගොවිතැන්ද කළ නොහැකිවූයෙන් කලා වැවෙන් ජලය සැපයෙන ඉඩම් පමණක් සාර්ථක ලෙස වගාකරන ලදී.

ප්‍රදේශයට ජීප් රථවලින් පිවිසිය හැකිවූවද, බොරළු සහිත පාරවල්වල ඒ වනවිටත් ගමනාගමනය අපහසු විය.

නව 'ඒකාබද්ධ සේවා මධ්‍යස්ථානය' ඉදිකරන ලදුව, ආරම්භ කර තිබුන නමුදු, මධ්‍යස්ථානය දුරස්ථ මෙන්ම පාලුවූ එකක් ලෙස පෙනින.

සියළුම ජනාවාසීන් ප්‍රාථමික (ශාඛා) සමුපකාරවල ලියාපදිංචි කරවීමේ අදහසින් කෘෂි හැඳුනුම්පත් නිකුත්කරනු ලැබිණ.

යෝජනාක්‍රම නිලධාරීහු, ජනාවාසීන් ගොවි සමිති පිහිටුවා ගත්තාට පසුව ඔවුන් පිළිවිසීම සඳහා බලාපොරොත්තුව සිටියහ.

යෝජනාක්‍රම සැලසුම්වලින් බලාපොරොත්තුවූ පාංශු සමීක්ෂණ ජනාවාසීන්ට දන්වා තිබුනේ නැත.*

පහත සඳහන් සංඛ්‍යා සටහන්වලින් පෙන්නුම් කරන අයුරු ජනාවාසී පවුල් සුපරීක්ෂාකාරීව තෝරාගැනීමක් සිදුවී නැත. වැඩිහිටියන් වැඩිදෙනෙකු සීමිත අධ්‍යාපනයක් සහිත අයවූ අතර, යැපීම් අනුපාතය ඉහළ විය. ඔවුන්ට ඉතිරිකිරීම් හෝ උසස් මට්ටමක ආයෝජනය සඳහා ශක්‍යතාවයක් හෝ ඇති බවක් නොපෙනිණ. මෙම සංඛ්‍යා සටහන් පිළිබඳ සවිස්තර සාකච්ඡාවක්, මහජන බැංකුවේ පර්යේෂණ අංශය මගින් පළකරන ලදී. [3] මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ මුල් ජනාවාසී කණ්ඩායමේ සමාජීය - ආර්ථික තත්ත්වයන් මෙම සංඛ්‍යා සටහන්වලින් නිරූපණය වේ.

## සම්භාෂණය.

### (අ) ඉදිරි 'පවරාදීම්'

කුඩා ව්‍යාප්ති ඇලමාර්ගවල ඉදිකිරීමේ කටයුතු කරනු ලබන අතරදීම මුල් ජනාවාසීන් කණ්ඩයම පදිංචි කරවන ලදී. යෝජනා ක්‍රමය මගින් කැලෑ ඉඩම් එළිකිරීමෙන් පසු පහත්බිම් කට්ටි බෙදා වෙන්කර, බොරළු පාරවල් තනා, ජනාවාසීන්ට ඉඩම් පවරාගන්නා ලෙස ඇරයුම් කරන ලදී. එහි මූලාකාරණය වන්නට ඇත්තේ, ජනාවාසීන්ට ඉදිකිරීමේ කටයුතුවල රැකියා නියුක්තිය ලබාගැනීමට හැකිවීම හා ජලය නිකුත් කරන කාලය වනවිට ඔවුන්ට සිය ඉඩම් සකස්කර නියර බැඳ ගැනීමට හැකිවීමද විය හැකිය.

කලාවැවේ වම් ඉවුරේ පිහිටි මෙම ඉඩම්වලින් සමහරක් වැවෙන් ලබාගත් ජලයෙන් වගාකර තිබුණි. සෙසු අතිමහත් ප්‍රදේශය නිරුදක වියළි බිමය. ප්‍රදේශයේ කන්න ගණනාවකදීම තද ඉඩෝරය පැවතියේය. මීට කලිනුදු එහි විසූ ගැමියන්ට පවා ප්‍රදේශයෙන් කිසිදු ආදායමක් ලබාගත නොහැකි වූ අතර, හේන් ගොවිතැන් පවා හානියට පත්වීම හෝ විනාශවීම හෝ සිදුවිය. ඉදිකිරීමේ කටයුතු උප කොන්ත්‍රාත් පදනම මත ඉටුකරනු ලැබූ අතර, කොන්ත්‍රාත්කරුවෝ නිතිපතා වැඩ නොදුන්හ. ආදායමක් උපයාගැනීමේ අභිප්‍රායයෙන් ජනාවාසීන් අනියම් කම්කරුවන් ලෙස වැඩකළ අතර, එසේ කිරීමේදී කුඹුරු සකස්කිරීමේ කටයුතුවල යෙදිය නොහැකි විය.

කැලෑ එළිකිරීමෙන් ස්වභාවික රිත්මය බිඳවැටීම නිසා, ලෙඩරෝග උවදුර පිළිබඳ තර්ජනය එල්ල විය. බෝවතැන්න ජලාශය ප්‍රදේශයෙන් විස්ථාපනය වී පදිංචියට පැමිණි දරුවන් හා බිළිඳුන් සහිතවූ පවුල් කිසිත් කරකියාගත නොහැකි තත්ත්වයක පසුවූහ. කිට්ටුම ඩිස්පෙන්සරිය සැතපුම් ගණනාවක් දුරින් පිහිටි අතර, ආරෝග්‍යශාලාව ඊටත් වඩා දුරින් පිහිටියේය. ප්‍රසිද්ධ ප්‍රවාහණ සේවා විරල වූ අතර පාසැල්ද නොවීය. ඉදිකිරීම් වැඩ නිමවා, කුඹුරුවලට ජලය සැපයීමට හැකි තත්ත්වයක් ඇතිකොට හා සේවා සංවිධානය කරනු ලැබුවාට පසුව ජනාවාසීන් පදිංචි කරවූයේ නම් මේ සියල්ල මගහරවා ගත හැකිව තිබුණි.

### (ආ) අවම 'සහනාධාර'

අළුතෙන් ඉඩම්වල ජනාවාස ඇතිකිරීමේදී වෙනත් අනිකුත් ආයෝජනවලදී මෙන්, ඉතිරිකිරීම්, ආධාර හෝ ණය ආදීවූ කවර ආකාරයකින් වුවද මුදල් අවශ්‍ය වේ. මෙය සහනාධාර පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එසේවුවද, පැහැදිලිව පෙනෙන අයුරු 'ආත්මෝපකාර' ප්‍රතිපත්තිය මත මෙම ජනාවාසීන්ට අවම සහනාධාර ලබාදෙන ලදී. පැල්පත ඉදිකර ගැනීමට රු. 100/- ක්ද, මසකට රු. 50/- බැගින් මාස 5 කට රු. 250/- ක යැපීම් දීමනාවක්ද ගෙවා ඇත. නියර තැනීමෙන් පසුව තවත් රු. 750/- ක මුදලක් ගෙවිය යුතුව ඇත. බෝවතැන්න ජලාශය ප්‍රදේශයෙන් විස්ථාපනය වූ ජනාවාසීන්ට සිය භාණ්ඩ ගෙන ඒම සඳහා ප්‍රවාහණ පහසුකම් සපයා ඇත. ලෝක ආහාර වැඩ සටහන යටතේ වියළි කිරි, පිටි,

* ක්ෂෙත්‍ර දැනුම්දෙන්නක් අනුව පාංශු සමීක්ෂණ නොපවත්වන ලදී. එහෙත් වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරියකු 'එච්' කලාපයේ පාංශු සමීක්ෂණ සම්පූර්ණකර ඇති බව පැහැදිලි කළේය. දැන් පාංශු සමීක්ෂණ සිතියම්, ජනාවාස සිතියම්වලට අවශෝෂණය කළ යුතුය. එසේවුවත්, යෝග්‍ය වගා පිළිබඳව ජනාවාසීන්ට උපදෙස් දී නැත. මෙය පසු අවදියකදී කරනු ලැබේයයි අපේක්ෂිතය.

සීනි හා ඇතැම්විට පරිප්පු ද අඩංගු සලාකයක් බැගින් සිවුදෙනෙකුගෙන් යුතු පවුලකට නිකුත්කරනු ලැබුවද එය නිතිපතා සිදුවී නැත.

මෙහි ප්‍රතිඵලය වූයේ ගොවීන්ට යම්තම් පැල්පතක් පමණක් ඉදිකරගැනීමට හැකිවීමය. පැරණි ගම්වලින් පැමිණි ජනාවාසීන් සිය නිවෙස්වලින් නෙරපීමේ තර්ජනය තිබියදීත් තවදුරටත් ඒවායේම රැඳී සිටියහ. ප්‍රමාණවත් නිවාස ආධාර නොලැබීම නිසා වැඩියෙන්ම පීඩාවට පත්වූවෝ බෝවතැන්නෙන් විස්ථාපනය වූ ගැමියන්ය. ඔවුහු තාවකාලික ආවරණ යට තමන් සතු භාණ්ඩ රැකවරණයට තබා පැල්පත්වල වාසය කළහ. ඔවුන්ට සිය ගොවිපළ සඳහා දෙනු ලබන ඉඩම් ඒ වනවිට ලබා නොදී තිබුණෙන් ඔවුන්ට හැකියාවක් තිබුණද වඩා ස්ථාවර හා යෝග්‍ය රැකවරණයක් ඉදිකරගැනීම නිෂ්ඵල වේ.

මේවා 'නව' ප්‍රතිපත්තීන්ය. 1941 දී පවා කුටියක් (Cottage) තනාගැනීමට රු. 250/- ක මුදලක් දෙන ලදී. 1951 දී කුටියක ඒකක පිරිවැය රු. 2700/- ක්ද, 1953 හා 1956 දී එය රු. 1600/- ක්ද විය. 1976 දී රු. 100/- කින් කෙබඳු කුටියක් ඉදිකළ හැකිද?

මූලාරම්භක අවදියේදී ලබාදී ඇති ආධාර කවර මට්ටමක් අනුව වුවද අතිශයින් අප්‍රමාණවත් ලෙස සැලකිය හැක.

**(ඇ) 'ප්‍රමාද කළ' වන්දි :—**

දේපළ අහිමිවීම සඳහා ජනාවාසීන්ට වන්දි ගෙවීමක් කර නැත. වන්දි ගෙවීම් කරනු ලබන්නේ, ඉල්ලුම් ආදිය පරීක්ෂාවට භාජනය කිරීමෙන් පසුවය. පළමුව, ගෙවිය යුතු වන්දි ඇගයුම් කර ගොවීන්ට එය ලබාදුන්නේ නම් අඩු වශයෙන් පවුල් කිහිපයකටවත් නව දිවිය මුල පිරීමට යම් පමණක මුදල් ඉතිරියක් තිබෙන්නට ඉඩ තිබුණි.

පැහැදිලිවම විස්ථාපනය සඳහා කිසිදු වන්දියක් ගෙවීමට බලාපොරොත්තු නොවිණ. නව ප්‍රදේශයක පදිංචිවීම නිසා ළමයින් සඳහා වෙනත් පාසැල් සොයාගැනීමට සිදුවීම ආදී කරුණු හේතු කොටගෙන මෙම අංශය පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුව තිබිණි.

**(ඈ) පවුල් සියල්ල 'විස්ථාපනය කිරීම' :—**

නව ප්‍රතිපත්තීන් යටතේ 'පුරාණ' ගම්වල පවුල් ඇතුලු පවුල් සියල්ලම විස්ථාපනය කරන ලදී. යෝජනා ක්‍රමය මගින් ඉඩම් පවරාගන්නා ලදුව නැවත බෙදා වෙන්කරන ලදී. පහත්බිම් සඳහා වාරි කර්මාන්ත සම්පාදනය කිරීමේදී එය අවශ්‍යයෙන්ම කළ යුතුවිය. රෑ ඉඩම් කැබලි කිරීමේ කාර්යය ආදිය සඳහාද එය අත්‍යාවශ්‍ය වූවා විය හැකිය. එසේවුවද එබඳු 'සැලසුම්කිරීම' හා සම්බන්ධ සැලසුම්කරුවෝ නොවූහ.

**(ඉ) පවුලකට අක්කර $2\frac{1}{2}$ ක් බැගින් ලබාදීම් ලෙස පැවසෙන සමානත්වය :—**

සෑම පවුලකටම පහත්බිම් වගාව සඳහා අක්කර $2\frac{1}{2}$ ක් හා ගොවිපළ සඳහා අක්කර $\frac{1}{2}$ ක් බැගින් වෙන්කරදීමෙන් වැඩි සංඛ්‍යාවකට ප්‍රමාණවත් ඉඩම් කට්ටියක් බැගින් වෙන්කරදීමට ඉඩ සැලසෙන බැවින් යුක්තිසහගත ලෙස පෙනේ. එසේ වුවද වෙන් වෙන්වූ ප්‍රදේශවල අක්කර $2\frac{1}{2}$ ක බිම් කැබලිවල ආර්ථික විභවතාවය එකිනෙකට වෙනස්වනු ඇත. මේ නිසා වඩා හොඳ ඉඩමක් ලැබීම 'වාසනාව' හෝ 'අනුග්‍රහය' මත රඳා පවතී.

**(ඊ) බඳවාගැනීමේ ප්‍රතිපත්ති 'අදල නොවන්නක්' ලෙස :—**

පවසා ඇති අන්දමට ජනාවාසීන් බඳවා ගනු ලැබුයේ ආර්ථික සම්භාව්‍යතා උපමානය අනුව හා ඉඩම් කච්චේරි ගණනාවක් පැවැත්වීමෙන් පසුවය.

එසේවුවද, විවිධ ප්‍රමාණයෙන් යුතු පවුල් දක්නා ලදී. එක පවුලක සාමාජිකයන් 14 දෙනෙක් වූ අතර, තවත් සිටියේ අවුරුදු 60 ඉක්මවූ වයස්ගත ස්ත්‍රියක් හා පුරුෂයකු පමණි. යැපීම් අනුපාත යද ඉතා අධික විය. වැඩිදෙනෙකු විශේෂයෙන්ම ගැහැණු අධ්‍යාපනයක් නොලද අය වෙති. පැරණි ගම්වලින් විස්ථාපනය වූ අයට ඉඩම් ලබාදීමට ඇති අවශ්‍යතාවය බඳුවූ අව්‍යාජ දුෂ්කරතා තිබුණා විය හැක. එමෙන්ම ශ්‍රී ලංකාවේ ව්‍යාප්ති පවුල් අනුව, ජනාවාසී පවුලක නියම සාමාජික සංඛ්‍යාව නිශ්චය කරගැනීමද දුෂ්කර කාර්යයකි. කරුණු කෙසේවුවද, සුපරීක්ෂාකාරී තේරීම් ක්‍රමයක් තිබී බවට සාක්ෂියක් දක්නට නොවීය.

**(උ) ගොවීන් හමුවීම කළ නොහැකි යෝජනාක්‍රම නිලධාරීන්:—**

යෝජනා ක්‍රමයට අනුයුක්ත සංවර්ධන සහකාරවරු හා ප්‍රජා සංවර්ධන නිලධාරීන් සිටිය නමුදු, ඔවුන්ට ජනාවාසීන් සමඟ කිසිඳු සම්බන්ධතාවයක් නොවීය. මෙම නිලධාරීන්ට, ජනාවාසීන්ට සහායදීම සඳහා අවශ්‍ය පහසුකම් නොවූයෙන් ඔවුහු ජනාවාසී සමාජය 'සංවිධාන' කිරීම සඳහා මීට වඩා සරු අවදියක් උදා වනතෙක් බලා සිටි ලෙසක් පෙනේ.

**(ඌ) කෘෂිකර්මාන්තය හා ආයෝජන පිළිබඳ උපදෙස්:—**

සමීක්ෂණය පැවැත්වෙන කාලය වනවිට පාංශු සමීක්ෂණ ජනාවාසීන්ට දනුම්දී නැත. එබැවින් යෝග්‍ය බෝග වර්ග ආදිය පිළිබඳව ඔවුන්ට උපදෙස් දී නැති බව සැලකිය හැකිය. කෙසේවුවද, වගා රටාවන් පිළිබඳව ජනාවාසීන්ට එතරම් පැහැදිලි හැඟීමක් නොවූ අතර, ජලය ලබාගත හැකිවූවිට වී ගොවිතැන් කිරීම හා එතෙක් සීමිත හේන් ගොවිතැනෙහි යෙදීමටද ඔවුහු බලාපොරොත්තු වූහ.

**(එ) සේවා :—**

ඒකාබද්ධ සේවා මධ්‍යස්ථානයක් හා ප්‍රමාණවත් සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා සැපයීමද සඳහා විසිතුරු සැලසුම් යෝජනා ක්‍රමයේ අන්තර්ගත වුවද, සමීක්ෂණය පැවැත්වූ කාලය වන විට ඒකාබද්ධ සේවා මධ්‍යස්ථාන ගොඩනැගිලි පමණක් ඉදිකර තිබිණ. සෞඛ්‍ය හා අනිකුත් සමාජීය සේවා හා පහසුකම් සැපයීම පිළිබඳ ප්‍රමාදයක් පැහැදිලිවම දක්නට විය.

ජනාවාසවල මූලාරම්භක අවදියේදී දක්නට ලැබුණු ලක්ෂණ කිහිපයකින්ම ඉතා පහත් මට්ටමේ ආයෝජන සහිත යැපීම් කෘෂිකර්මාන්තයක් සඳහා වාතාවරණයක් සැකසෙන බැවින් එය මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ජල සම්පාදිත ප්‍රදේශයන්හි ආයෝජන පිළිබඳ නව යුගයක උදාව ගෙනෙන වාරි කර්මාන්ත පද්ධතියක් සඳහා උචිත නොවන බව පෙනේ. තිරසාර මූලාරම්භයක පදනම මත අප ආර්ථිකයේ හා රටේ නව යුගයක් උදාකිරීම උදෙසා ජනාවාසයන්හි මූලාරම්භයේදී යුක්ති සහගත අන්දමින් ආධාරෝපකාර ලබාදීම හෝ කුඹුරුවලට ජලය සැපයීම හා අනිකුත් සේවාවන්ද සැපයිය හැකි අවදියකදී ජනාවාස ආරම්භ කිරීම හෝ අත්‍යවශ්‍ය ලෙස පෙනේ.

**ආශ්‍රිත ග්‍රන්ථ :—**


1. Mahaweli Development Board, 1977, Mahaweli Ganga Development Sri Lanka: Summary Report on Projects. p.2.

2. Mahaweli Development Board and Sogreah, Grenoble, France, 1972, Mahaweli Development Project I-Feasibility Study for Stage II, Vol. VII and VIII-Settlement Planning and Development.

3. Karunatilake, Dingi, 1976, A study of the Socio-economic Conditions and Investment Potentialities of the Settlers of the Mahaweli Development Project. The report of a Field-Survey of the First Stage of Settlers. (People's Bank, Research Department, Study Papers, 1976, Cyclostyled).

### 1 සංඛ්‍යා සටහන — වයස් ව්‍යුහය

| වයස් කාණ්ඩය | පිරිමි | ගැහැණු | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 0 — 5 | 48 | 29 | 17 | 17 |
| 5 — 10 | 34 | 43 | 77 | 17 |
| 10 — 15 | 32 | 26 | 58 | 12.9 |
| 15 — 20 | 24 | 28 | 52 | 11.9 |
| 20 — 25 | 22 | 25 | 47 | 10.4 |
| 25 — 30 | 15 | 19 | 34 | 7.5 |
| 30 — 40 | 16 | 28 | 44 | 9.7 |
| 40 — 50 | 20 | 13 | 33 | 7.3 |
| 50 — 60 | 15 | 2 | 17 | 3.9 |
| 60 ට වැඩි | 5 | 7 | 12 | 2.6 |
| මුළු ගණන | 231 | 220 | 451 | 100.0 |

### 2 සංඛ්‍යා සටහන — පවුලේ ප්‍රමාණය

| පවුලේ ප්‍රමාණය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| 1 | — |
| 2 | 8 |
| 3 | 6 |
| 4 | 7 |
| 5 | 11 |
| 6 | 11 |
| 7 | 12 |
| 8 | 5 |
| 9 | 5 |
| 10 | 3 |
| 11 | 5 |
| 12 | — |
| 13 | — |
| 14 | 1 |
| මුළු ගණන | 74 |

3 සංඛ්‍යා සටහන — අධ්‍යාපනික තත්ත්වය

| අධ්‍යාපනික තත්ත්වය | අවුරුදු 5 ට වැඩි අය | % |
|---|---|---|
| අධ්‍යාපනයක් නොලැබූ .... .... .... .... | 103 | 27.54 |
| 5 වන ප්‍රමාණය දක්වා .... .... .... .... | 173 | 46.26 |
| 5 වන ප්‍රමාණයේ සිට අ.පො.ස. (සා. පෙ.) දක්වා .... .... | 93 | 24.87 |
| අ.පො.ස. (සා. පෙ.) ට වැඩි .... .... .... .... | 5 | 1.33 |
| මුළු ගණන .... .... .... .... | 374 | 100.00 |

4 වන සංඛ්‍යා සටහන — පවුල්වලට අවම අධ්‍යාපනික ප්‍රවීණතාවයන්

| | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| අධ්‍යාපනයක් ලබා ඇති අය .... .... .... .... | 5 | 6.76 |
| එක් අයෙකුවත් 5 වන ප්‍රමාණය දක්වා උගත් .... .... | 60 | 81.08 |
| එක් අයෙකුවත් අ.පො.ස. (සා. පෙ.) දක්වා උගත් .... .... | 4 | 5.41 |
| එක් අයෙකුවත් අ.පො.ස. (සා. පෙ.) ට වඩා උගත් .... .... | 5 | 6.75 |
| මුළු ගණන .... .... .... .... | 74 | 100.00 |

5 වන සංඛ්‍යා සටහන — රැකියා නියුක්තිය (ඔවුන් විසින්ම වර්ග කර ඇති අයුරු)

| | සංඛ්‍යාව | % |
|---|---|---|
| පූර්ණ කාලීන ගොවීන් .... .... .... .... | 71 | 26 |
| අර්ධකාලීන ගොවීන් .... .... .... .... | 189 | 68 |
| කම්කරුවන් .... .... .... .... | 13 | 5 |
| වෙළඳුන් .... .... .... .... | 1 | — |
| වෙනත් .... .... .... .... | 4 | 1 |
| මුළු ගණන .... .... .... .... | 278 | 100 |

6 වන සංඛ්‍යා සටහන — එක් පුද්ගලයකුට ලැබෙන ඉඩම් ප්‍රමාණය

| | සංඛ්‍යාව | පහත් බිම් | එක් අයෙකුට | මුළු බිම් ප්‍රමාණය | එක් අයෙකුට |
|---|---|---|---|---|---|
| අවුරුදු 15 ට වැඩි | 239 | 185 | 0.77 | 222 | 0.93 |
| අවුරුදු 15 ට වැඩි පිරිමි | 117 | 185 | 1.60 | 222 | 1.90 |

7 වන සංඛ්‍යා සටහන — කලින් අවුරුද්දේ ජනාවාසී පවුල්වල වාර්ෂික ආදයම

| ආදයම් කාණ්ඩය | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| රු. 500 දක්වා | 7 | 9.5 |
| 500 — 1000 | 11 | 14.9 |
| 1000 — 1500 | 7 | 9.5 |
| 1500 — 2000 | 9 | 12.2 |
| 2000 — 2500 | 12 | 16.2 |
| 2500 — 3000 | 6 | 8.1 |
| 3000 — 4000 | 12 | 16.2 |
| 4000 ට වැඩි | 10 | 13.5 |

8 වන සංඛ්‍යා සටහන — ණයගැතිභාවය

| | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| රු. 500 ට අඩු | 10 | 13.5 |
| 500 — 1000 | 3 | 4.05 |
| 1000 — 2000 | 3 | 4.05 |
| 2000 සහ ඊට වැඩි | 2 | 2.7 |
| වාර්තා නොවූ | 56 | 75.6 |

9 වන සංඛ්‍යා සටහන — කලින් ඉඩම්වල අයිතිය

| | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| ඉඩම් නැති | 42 | 56.7 |
| අක්කර 1 දක්වා | 8 | 10 8 |
| අක්කර 1 — 3 දක්වා | 15 | 20.2 |
| අක්කර 3 — 5 දක්වා | 9 | 12.16 |

10 වන සංඛ්‍යා සටහන — වත්කම්

| | රු. 1000 ට අඩු | රු. 1000 — 2000 | රු. 2000 — 3000 | රු. 3000 — 4000 | රු. 4000 ට වැඩි |
|---|---|---|---|---|---|
| පාපැදි, ඇඳුම් මහන මැෂින් බඳු | | | | | |
| වංචල වත්කම් | 4 | 1 | 3 | — | — |
| හරක් | 2 | 3 | 1 | — | 6 |
| කෘෂිකාර්මික උපකරණ | 1 | — | — | — | — |
| අත්හළ නිවසේ වටිනාකම | 8 | 3 | 5 | 1 | 31 |

(පවුල් 21 කට ඔවුන් සතු නිවෙස් නොතිබිණ — පවුල 5 ක් තොරතුරු සපයා නැත)

# 'එච්' සංවර්ධන කලාපයේ ජනාවාස සැලසුම් කිරීම

**පර්සි සිල්වා**

**භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය, කොළඹ මණ්ඩපය**

මහවැලි වැඩ සටහනෙහි එක් ප්‍රධාන අරමුණක් වනුයේ පවුල් ගොවිපළවල් පදනම් කොටගත් ජනාවාස කාර්යාවලියක් මගින් වියළි කලාපයේ කෘෂිකර්මාන්තය සංවර්ධනය කරලීමය. මෙම අරමුණට අනුකූලව, කලාඔය ද්‍රෝණියේ පිහිටි 'එච්' සංවර්ධන කලාපයේ පවුල් 24512 ක් පදිංචි කරවීම සඳහා සැලසුම් නිර්මාණය කර ඇත. මෙයින් පවුල් 6007 ක් මේ වනවිටත් පදිංචිකරවා ඇති අතර, ඉතිරි පවුල් සංඛ්‍යාව මීළඟ අවුරුදු කිහිපය ඇතුළතදී පදිංචි කරවීමට අපේක්ෂා කරනු ලැබේ.

අක්කර 70,000 ක බිම් ප්‍රමාණයෙන් යුතු 'එච්' කලාපය භූ ලක්ෂණ හා ජලවහනය අනුව ප්‍රධාන කොටස් හයකට බෙදා වෙන්කර ඇත. මේ සෑම කොටසක්ම ක්ෂුද්‍ර මට්ටමේ භූ ලක්ෂණාත්මක හා ජලවහන වෙනස්කම් අනුව නැවතත් කට්ටිවලට බෙදා ඇත. මෙම කට්ටි ඇතුළත සෑම කට්ටිකරුවකුටම ජල සම්පාදනය කළහැකි ඉඩම් අක්කර $2\frac{1}{2}$ ක් හා ගොවිපළ සඳහා ජල සම්පාදනය කළ නොහැකි ඉඩම් අක්කර $\frac{1}{2}$ ක්ද ලබාදී ඇත.

මෙම කට්ටි විවිධ ප්‍රමාණයෙන් යුක්තවන බැවින් ඒවායේ අන්තර්ගත බිම් කට්ටි සංඛ්‍යාවද ඒ අනුව වෙනස් වේ. එච් 1 හා එච් 2 කලාපයන්හි දැනටමත් ගොවීන් පදිංචි කරවා ඇති කට්ටිවල ජල සම්පාදනය කළහැකි මුළු බිම් කට්ටි හා ගොවිපළවල් සංඛ්‍යාව 1 වන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

### 1 වන සංඛ්‍යා සටහන

එච් 1 හා එච් 2 කලාපයන්හි ජල සම්පාදනය කළ හැකි බිම් කට්ටි හා ගොවිපළවල් බෙදී ඇති අයුරු

| කලාපය | කට්ටි | ජලසම්පාදනය කළ හැකි බිම්කට්ටි සංඛ්‍යාව | ගොවිපළවල් සංඛ්‍යාව |
|---|---|---|---|
| එච් 1 | 301 | 271 | 577 |
| | 302 | 681 | 881 |
| | 303 | 217 | 535 |
| | 304 | 602 | 829 |
| | 308 | 258 | 367 |
| එච් 2 | 305 | 567 | 601 |
| | 306 | 481 | 475 |
| | 307 | 355 | 356 |
| | 309 | 413 | 467 |
| | 310 | 248 | 362 |
| | 311 | 317 | 470 |
| | 313 | 447 | 683 |
| | 314 | 488 | 482 |

මූලාශ්‍රය:— ජනාවාස සැලසුම්කිරීමේ අංශය, මහවැලි සංවර්ධන මණ්ඩලය.

ක්ෂුද්‍ර මට්ටමේ භූ ලක්ෂණාත්මක විෂමතාවයන් හා ගුරුත්ව වහනය පදනම්ව ඇති වාරි කර්මාන්ත පද්ධතීන් සංවර්ධනය කිරීම හේතුකොටගෙන මීට පෙර ක්‍රියාත්මක කරනු ලැබූ සෑම ජනාවාසී ව්‍යාපාරයකම ගොවිපළවල් ජලසම්පාදනය කළ හැකි ඉඩම්වලින් වෙන්ව පිහිටියේය. එච් කලාපයේ ප්‍රචලිත භූ ලක්ෂණාත්මක තත්ත්වයන් හා වාරිකර්මාන්ත පද්ධතිය අනිකුත් කලාපවල තත්ත්වයන් හා සමාන වන බැවින්, මේවා එසේ වෙන්ව පිහිටීම නොවැලැක්විය හැකිවිය. එසේ වුවද බිම් කට්ටි මෙසේ වෙන්ව පිහිටීමෙන් ඇතිවිය හැකි හානිකර ප්‍රතිඵල අඩුකරගැනීම සඳහා මහවැලි අධිකාරීන් ජලසම්පාදනය කළහැකි ඉඩම් කට්ටි හා සම්බන්ධ ගොවිපළවල් සැතපුම් $2\frac{1}{2}$ ක් ඇතුළත පිහිටුවීමට වගබලාගත්හ.

'එච්' කලාපය සඳහා සැලසුම්කර ඇති ජනාවාස වර්ගයද අනිකුත් ජනාවාසී ව්‍යාපාරවල ඒවාට වඩා වෙනස්ය. මේ දක්වා සෑම ජනපද ව්‍යාපාරයකම ජල සම්පාදනය කළ නොහැකි කට්ටි නැතහොත් 'ගොවිපළ' රේඛීය අන්දමකින් ව්‍යාප්තකර තිබිණ. රේඛීය වර්ගයේ ජනාවාසවලින් අනේකවිධ ප්‍රශ්න පැනනැගී අතර (1) ගොවිපළ හා ජලසම්පාදනය කළහැකි කට්ටි අතර දුර ප්‍රමාණය (2) පොදු පහසුකම් සැපයීම හා උපයෝගීකරගැනීමේදී මතුවන දුෂ්කරතා (3) ගොවිජනතාව අතර වඩාත් හොඳ සම්බන්ධතාව හා ඒකාබද්ධතාවය ඇති කිරීමේ ගැටළු හා (4) ජනාවාසීන් තුළ ආත්ම-අනන්‍යතාවය ඇති නොවීම ආදිය වඩාත් වැදගත් ප්‍රශ්න ලෙස සැලකිය හැකිය. මෙබඳු ප්‍රශ්න හේතුකොටගෙන රේඛීය වර්ගයේ පදිංචිය වෙනුවට 'පොකුරු' වර්ගය යොදගෙන ඇති අතර එක් වාරිමාර්ග පොළකට එක් 'පොකුරක්' අනුකූලව පවතී.

එක් එක් කට්ටිය ඇතුළත ගොවිපළවල් කුඩා ගම් වශයෙන් බෙදවෙන්කර ඇත. එක කට්ටියක් ඇතුළත ඇති කුඩාගම් සංඛ්‍යාව හා එක ගමකට අයත් ගොවිපළවල් සංඛ්‍යාවද, කට්ටියේ ප්‍රමාණය හා එහි පාරිසරික තත්ත්වයන් ද අනුව වෙනස් වේ. "එච් 1" කලාපයේ තෝරාගත් කට්ටි කිහිපයක කුඩාගම් සංඛ්‍යාව හා ඊට අයත් ඉඩම් කට්ටි ප්‍රමාණයද 2 වන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

### 2 වන සංඛ්‍යා සටහන

කට්ටි 301, 302 හා 308 හා කුඩාගම් හා ගොවිපළවල් බෙදී ඇති අයුරු

| කට්ටිය | කුඩාගම | එක් කුඩාගමකට අයත් ගොවිපළ සංඛ්‍යාව |
|---|---|---|
| 301 | 1 | 117 |
| | 2 | 120 |
| | 3 | 176 |
| | 4 | 164 |
| 302 | 1 | 96 |
| | 2 | 140 |
| | 3 | 156 |
| | 4 | 128 |
| | 5 | 223 |
| | 6 | 138 |
| 308 | 1 | 127 |
| | 2 | 113 |
| | 3 | 128 |

මූලාශ්‍රය:— ජනාවාස සැලසුම්කිරීමේ අංශය, මහවැලි සංවර්ධන මණ්ඩලය.

පවුල් 100 සිට 150 දක්වා පමණ සංඛ්‍යාවකින් යුතු කුඩාගමක් "හසුරුවාගැනීමට පහසු ප්‍රමාණයේ සමාජීය ඒකකයක් පිළිබඳ සංකල්පනාවට සාමාන්‍යයෙන් අනුකූල වන බැවින්" එය උචිත ප්‍රමාණයක් ලෙස සලකන ලදී. එපමණක්ද නොව "ඒකාබද්ධතා බැඳීම නිර්බාධිතව පවත්වාගෙන යාම සඳහා එබඳු පරිමාණයක් ගම්වාසීන්ට හා පැරණි ජනාවාසීන්ට වඩාත් උචිත බවද දක්වන ලදී. ඒ අනුව අලුත් ගමක් ගමේම නායකයන් විසින් පාලනය කරනු ලැබීම හා ඔවුන් විසින් සමාජීය න්‍යාය හසුරවනු ලැබීම හා බාහිර අධිකාරීන් කෙරෙහි බලාපොරොත්තුව නොසිට වගා කාලසටහන නිවැරදිව ක්‍රියාත්මක කරවීමද කළ හැකිය."

මීට පෙරවූ ජනපද ව්‍යාපාරවල දක්නට ලැබුනු ප්‍රධාන ගැටළුවකි ඒ ඒ ජනාවාස තුළ පවා දක්නට වූ සංස්කෘතික හා සමාජීය විෂමජාතීයතාවය. රේඛීය වර්ගයේ ජනාවාස ඇතිකිරීම හා මිනිසුස් සමූහගත කිරීමේදී සමාජීය හා සංස්කෘතික සාධක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් නොදැක්වීම නිසා මෙම ප්‍රශ්න උද්ගත වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලිකත්වය ප්‍රවර්ධනය වූයෙන් ගොවීන් සමාජීය කණ්ඩායම සමග අනන්‍යතාවයක් ඇති කර ගැනීම සිදු නොවිණ. මෙම ගැටළු හැකිතරම් අඩුකරගැනීමේ අරමුණ සහිතව, මහවැලි අධිකාරීන් හැකිතරම් දුරට කුඩාගම්වල එක හා සමාන භූ–සංස්කෘතික පසුබිමක් හා සමාන සමාජීය තරාතිරමක් මෙන්ම හැකි සෑම තැනකදීම සමාන කුල සබඳතා ඇති අය එක් කිරීමෙන් ජනා වාසීන් අතර සංසක්තිත්වය, හා ඒකාබද්ධතාවයද ප්‍රවර්ධනය කිරීමට ප්‍රයත්න දරා ඇත.

කට්ටිකරුවන් තෝරාගැනීම හා ඔවුන් පවුල් ගොවිපළවල පදිංචිකරවීම ජනාවාස පිළිබඳ එක් මුහුණුවරක් පමණි. මේ හා සමාන වැදගත්කමකින් යුතු තවත් අංශයකි ජනාවාසීන්ට ඔවුන්ගේ කෘෂිකාර්මික හා වෙනත් ආර්ථික කටයුතුවල නිරතවීම සඳහා පමණක් නොව, ඔවුන්ගේ දෛනික කාර්යයන් සඳහා අවශ්‍ය අධෝව්‍යුහමය සේවා සැපයුම. මීට පෙරවූ ජනාවාස ව්‍යාපාරවල මෙම සේවා ප්‍රමාණවත් ලෙස නොසපයනු ලැබූ අතර, සපයනු ලැබූ සේවාවුවද යෝග්‍ය නොවූ ස්ථානයන්හි සපයා ඇත. අධික වියදම් දැරීමට සිදුවීම හා මූලික සේවා සැපයීමේ ප්‍රශ්නය හේතු කොටගෙන සෑම සේවා මධ්‍යස්ථානයකදීම ජනාවාසීන්ට අවශ්‍ය සේවා සියල්ලක්ම සැපයීම කළ නොහැක. එබැවින් 'එච්' කලාපයේ සැලසුම් අනුව, කුඩාගම් මධ්‍යස්ථාන, ග්‍රාමීය මධ්‍යස්ථාන හා නාගරික යන අනුපිළිවෙලින් මට්ටම් 3 කදී මෙම සේවා සැපයීමට අදහස්කර ඇත. එච් කලාපය ඇතුලත මෙම මධ්‍යස්ථාන ව්‍යාප්තිවී ඇති අයුරු 3 වන සංඛ්‍යා සටහනෙන් පෙනේ.

## 3 වන සංඛ්‍යා සටහන

'එච්' කලාපයේ කුඩාගම් මධ්‍යස්ථාන, ග්‍රාමීය මධ්‍යස්ථාන හා නාගරික ව්‍යාප්ත වී ඇති අයුරු.

| ප්‍රදේශය | කට්ටි | කුඩාගම් මධ්‍යස්ථාන | ග්‍රාමීය මධ්‍යස්ථාන | නාගරික |
|---|---|---|---|---|
| එච් 1 | 5 | 23 | 2 | 1 |
| එච් 2 | 9 | 43 | 2 | 1 |
| එච් 4 | 10 | 79 | 12 | 2 |
| එච් 5 | 11 | 67 | 10 | 2 |
| එච් 7 | 4 | 26 | 2 | 2 |
| එච් 9 | 5 | 21 | 3 | 1 |
| මුළු ගණන | 44 | 259 | 31 | 9 |

මූලාශ්‍රය:— ජනාවාස සැලසුම්කිරීමේ අංශය,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

මෙම මධ්‍යස්ථානවලදී සපයනු ලබන සේවා පාලන, වාණිජ කෘෂිකාර්මික, අධ්‍යාපනික, සංස්කෘතික, සෞඛ්‍ය හා ප්‍රසිද්ධ වැසිකිළි, සුසාන භූමි බඳු වෙනත් පහසුකම් යනුවෙන් කොටස් 7 කට වර්ගකර ඇත. ඒ ඒ මධ්‍යස්ථානවලදී සපයනු ලබන සේවා ගණනාව ජනාවාසයේ මට්ටම අනුව වෙනස්වනු ඇත. කුඩාගම් මධ්‍යස්ථානයක් මගින් පුද්ගලයන් 200 සිට 600 පමණ සහිත වූ පවුල් 100 සිට 125 දක්වා ප්‍රමාණයකට සේවා සලසනු ලැබේ. කුඩාගම් මධ්‍යස්ථානය ඉතාමත්ම පහළ මට්ටමේ සේවා මධ්‍යස්ථානයක් වන බැවින් එමගින් පාලනමය කාර්යභාරයක් ඉටු කරනු නොලැබේ. ග්‍රාමීය මධ්‍යස්ථානය මීලඟට වැදගත්කමින් යුතුවන අතර පවුල් 500 සිට 700 දක්වා සංඛ්‍යාවකින් යුතු කුඩාගම් 4 කට හෝ 6 කට සේවය කරනු ඇත. සේවය කරනු ලබන මුළු සංඛ්‍යාව පවුල් 2500 ටත් 3000 ටත් අතර වනු ඇත. එහි විශාලත්වය හා පිහිටීම හේතුකොටගෙන ග්‍රාමීය මධ්‍යස්ථානයක් මගින් කුඩාගම් මධ්‍යස්ථානයකට වඩා වැඩි කාර්යභාරයක් හා වැඩි සේවා ගණනාවක් ඉටුකරයි. ග්‍රාමීය මධ්‍යස්ථානය ලඟට වැදගත්වන නාගරිකය මගින් 'ගම් සමූහ' 5 කට හෝ 6 කට සේවය කිරීම අපේක්ෂා කරනු ලැබේ. මෙබඳු 'ගම් සමූහ' පවුල් 3000 සිට 3600 ක් පමණ වූ සංඛ්‍යාවක් විය හැකි වන අතර, මුළු ජනගහනය 15,000 හා 20,000 අතර වේ. අනිකුත් මධ්‍යස්ථාන දෙකට වඩා උසස් මට්ටමකින් යුතුවීම නිසා නාගරික මධ්‍යස්ථානයක් මගින් ඒවාට වඩා පාථුල වූ සේවා ගණනාවක්ම සලසනු ලැබේ. ඒ ඒ මට්ටමෙහිදී සලසනු ලබන සේවාවන් 4 වන සංඛ්‍යා සටහනෙන් පෙනේ.

ග්‍රාමීය මධ්‍යස්ථාන හා නාගරිකයන් සඳහා යෝග්‍ය කාර්මික පදනමක් දැමීමට සැලසුම් ලිපියෙල කර ඇත. ග්‍රාමීය මට්ටමෙහි කර්මාන්තවලට රෙදි විවීමේ මධ්‍යස්ථානයක්, ගෘහ කර්මාන්ත හා කුඩා ප්‍රමාණයේ වී මෝලක් හා කෙඳි සැකසුම්කිරීමේ කර්මාන්තයක්ද ඇතුලත් වේ. වඩාත් විශාල කර්මාන්ත පිහිටවනු ලබන්නේ නාගරික මට්ටමෙහිදීය. රෙදි කම්හලක්, සහල් මෝලක් හා රටකජු තෙල් හා පිදුරුවලින් භාණ්ඩ නිපැයුම බඳුවූ කෘෂිපාදක කර්මාන්ත ආදිය සඳහා වෙනත් වර්ගවල කර්මාන්තශාලාද අයත් වේ.

සකස්කර ඇති සැලසුම් ප්‍රායෝගික වැදගත්කමකින් යුතුවීම සඳහා ඉක්මනින් හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කළ යුතුය. සේවා පහසුකම් පිළිබඳව මෙය විශේෂයෙන්ම සත්‍යයකි. මීට පෙර ජනයා පදිංචි කරවීම හා මූලික සේවා පහසුකම් සැලසීමද අතර කාලයේ පරතරය බොහෝ පුළුල් විය. එපමණක්ද නොව, ඇතැම් පහසුකම් සලසනු ලැබුවාට පසුව වුවද ඒවා සතුටුදායක තත්ත්වයකට ගෙන ඒම සඳහා දීර්ඝ කාලයක් ගතවී ඇත.

මෙම කරුණු හේතුකොටගෙන ජනාවාසීන්ට අනපේක්ෂිත දුක් ගැහැටවලට මුහුණපෑමට සිදුවූ අතර එම ප්‍රදේශවල සිය වාසය තහවුරු කරගැනීම එමගින් වැළකී ඇත. සැලසුම් ක්‍රියාත්මක කරවීමේදී ඇතිවූ ප්‍රමාද හේතුකොට පැනනැගී සැලසුම් නොකළ වර්ධනයද මෙබඳු තවත් බරපතල ප්‍රශ්නයකි. සැලසුම් නොකළ වර්ධන සමහරක් නිසැකයෙන්ම යහසාධක වුවද, එමගින් සැලසුම් කළ සේවා මධ්‍යස්ථානවල වර්ධනය මන්දගාමී වීම හා සැලසුම් කළ ඉඩම් පරිහරණ රටාවන්ට හාත්පසින්ම වෙනස්වූ රටාවන් බිහිවීමද එයින් සිදුවී ඇත. එච් කලාපයේ නව ජනාවාස සාර්ථක ප්‍රජාවන් ලෙස බිහිවීමට නම් මෙම ගැටළු සියල්ලම මඟහරවාගත යුතුය.

එච් කලාපයේ ජනාවාස සැලසුම්කිරීම බෙහෙවින් සිනිවිල්ලට භාජනයව ඇති අතර එහි ප්‍රතිඵලය වී ඇත්තේ එය මීට පෙර ජනාවාස සැලසුම් කළ ආකාරයෙන් වෙනස්වීමය. සැලසුම් කාර්යාවලියෙහි නව සංකල්ප කිහිපයක් ඒකාබද්ධ කර ඇති අතර, 'සමූහ' වර්ගයේ ජනාවාස හා අනුපිළිවෙලින් සේවා සැලසීමේ කාර්යාවලිය මේ පිළිබඳව වැදගත් වේ. සංකල්ප සියල්ලම හඳුන්වා දී ඇත්තේ යම් විශේෂිත අරමුණු මුදුන්පත් කරගෙන වුවද ඒවා ඉෂ්ටකරගැනීම සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මත රඳා පවතිනු ඇත.

4 වන සංඛ්‍යා සටහන

# අධෝ ව්‍යුහ සේවා

| ජනාවාස මට්ටම | පාලනමය | වාණිජ | කෘෂිකාර්මික | අධ්‍යාපනික | සංස්කෘතික | සෞඛ්‍ය | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| පවුල් 100 – 125 (ජනයා 500 – 600) | | සමුපකාර වෙළඳසැල තැපැල් පෙට්ටිය කඩ | නියෝජිත ගොවි සංවිධාන | ප්‍රාථමික පාසැල් | විනෝදස්වාදය, ආගමික හා ප්‍රජා කටයුතු සඳහා වෙන්කළ යුතු ප්‍රදේශ | ජංගම බෙහෙත් ශාලාව | සුසාන භූමි (කුඩාගම් දෙකකට එකක් බැගින් |
| කුඩාගම් 4–6 ක් සඳහා ගම් පොකුරක්. පවුල් 500 – 700 (ජනයා 2500 – 3500) | ග්‍රාමසේවක කාර්යාලය දිසා කාර්යාලය (ගම් පොකුරු දෙකකට එක බැගින්) | සමුපකාර සමිති ශාඛාව හා සමුපකාර වෙළඳසැල, උපතැපැල් කාර්යාලය (ගම් පොකුරු දෙකකට එක බැගින්) අළුත්වැඩියා කිරීමේ ස්ථාන සාප්පු හා ඉරිදු පොල (පොල සඳහා භූමිය) | පෝර ගබඩාව, වී ගබඩාව, ට්‍රැක්ටර අළුත්වැඩියා කරන ස්ථානය යෝජනාක්‍රම කායාංශල (සමූහ මට්ටමේ) | ප්‍රාථමික අධ්‍යාපනික ආයතන, කණිෂ්ඨ ද්විතීය පාසැල්, ක්‍රීඩා භූමිය. | ප්‍රජා මධ්‍යස්ථානය විවිධ සේවා ශාලාව කියවීම් ශාලාව, පුස්තකාලය, ක්‍රීඩා භූමිය ආදිය, ආරක්ෂා කළ යුතු පුරාවිද්‍යාත්මක හා ගෘහ නිර්මාණාත්මක නටබුන්, ආගමික ආයතන, පන්සල, පල්ලි, කෝවිල, මුස්ලිම් දේවස්ථාන ආදිය. | මහජන සෞඛ්‍ය වින්නඹු මාතාව, බෙහෙත් ශාලාව (ගම් පොකුරු දෙකකට එක බැගින්) | බස් නවතන ස්ථාන රියගාල් අභය භූමි ප්‍රසිද්ධ වැසිකිලි |
| නාගරික ගම් පොකුරු 5 – 6 පවුල් 3000 – 3600 (ජනයා 15000 – 20000) | නගර සභාව දිසා හා ප්‍රාදේශීය කාර්යාලය පොලිස් මධ්‍යස්ථානය | විවිධසේවා සමුපකාර සමිතිය – ප්‍රාථමික සමුපකාර සිල්ලර වෙළඳසැල, තැපැල් කාර්යාලය, බැංකු, ප්‍රධාන වෙළඳපල, සාප්පු, අළුත්වැඩියා කිරීමේ ස්ථාන, පැට්‍රෝල් වෙළඳසැල්, සිනිමා ශාලා | කෘෂිකාර්මික අභ්‍යාස මධ්‍යස්ථාන, උප ප්‍රදේශ ගොවි කම්ටු කාර්යාලය, වී ගබඩාව, පොහොර ගබඩා, කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන. | ජ්‍යෙෂ්ඨ ද්විතීය පාඨශාලාව හා ක්‍රීඩා භූමිය වෙනත් අධ්‍යාපනික ආයතන (තාක්ෂණික හා වාණිජ) | ප්‍රජා මධ්‍යස්ථානය, බහුකාර්ය ශාලාව, පුස්තකාලය, ක්‍රීඩා භූමිය, සිනමා ශාලා, ආදිය. ආගමික ආයතන ආරක්ෂා කළයුතු පුරාවිද්‍යාත්මක හා ගෘහ නිර්මාණාත්මක නටබුන්. | මධ්‍යම බෙහෙත් ශාලාව, හා මාතෘ නිවාසය, මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානය රෝහල්, පර්‍යන්ත හෝ ග්‍රාමීය රෝහල් | ප්‍රධාන බස් නැවතුම් පොල, බස් නවතන ස්ථාන, දුම්රිය මාර්ගයක් තිබේ නම් දුම්රිය නැවතුම් පොල, රියගාල්, ප්‍රසිද්ධ වැසිකිලි සුසාන භූමිය හා ආදහනාගාරය |

මූලාශ්‍රය:— ජනාවාස සැලසුම්කිරීමේ අංශය, මහවැලි සංවර්ධන මණ්ඩලය.

# මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ මැලේරියා රෝගය මර්ධනය කිරීමේ වැදගත්කම

ඒ. එන්. ඒ. අබයසුන්දර

## මැලේරියා මර්ධන ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ මැලේරියා රෝග වාහකයා ඇනොපිලිස් කියුලිසිෆේජ්-සීස් යන මදුරු වර්ගයේ ගැහැණු සතාය. මොවුහු අපවිත්‍ර නොවූ, ගලා නොබස්නා හෝ සෙමින් ගලාබස්නා මිරිදිය ජලයෙහි බෝවෙති. මෙම මදුරු වර්ගය සෙවනට වඩා හිරු එළිය ප්‍රිය කරන්නාවූද වියලි කලාපයට බෙහෙවින් සීමාවූ වර්ගයක් ද වන අතර එහි කැලෑවෙන් වැසුණු තැනිතලා බිම්වල හා ගම්වලද ගහණය. මෙම මදුරු වර්ගය ඔවුන්ගේ රුධිර අන්නය මිනිසුන්ට වඩා වන සතුන්ගෙන් ලබාගැනීමට වැඩි රුචියක් දක්වයි. නියං සමයන්හිදී ඇනොපිලිස් කියුලිසිෆේසිස් මදුරුවා ගංගා පත්ලවල කුඩා දිය කඩිති හා ගල්වැටිවල රැඳි දිය කඩිතිවලද බෝවේ. නියං කාලවලදී පහසුවෙන් ජලය ගලා නොබැසීම හේතුකොට ගෙන ඇල මාර්ග හා දියපාරවල්වල දිය කඩිති ඇතිවීම නිසා කෘත්‍රිම වාරිමාර්ගවල හා ඇළවලද මදුරුවන් බෝවීම සිදුවේ.

නව ඉඩම්වලට ජල සම්පාදනය කිරීමට හා දූනට ලබාදෙන ජල සැපයුම් තවත් තරකිරීමද සඳහා ගංගා හැරවීම කරනු ලබන මහවැලි සංවර්ධන ව්‍යාපාරය බඳුවූ මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රමවල දූනටමත් අධිජ්කදේශික ප්‍රදේශවල මැලේරියා රෝගය පැතිරයාමට ඉඩකඩ ඇත.

කැලෑ එළිකොට ඇලමාර්ග ව්‍යාප්ත කොට ඇති අතර, සිවු පාවුන් මෙම ප්‍රදේශවලින් පළාගොස් ඇත. ජනාවාසීන් බඳුවූ ඒකරාශි කළ ජන කොට්ඨාශ මේවායේ පදිංචි කරවනු ලැබේ. මොවුන්ගෙන් වැඩි දෙනෙකු මැලේරියා රෝගය එතරම් තදින් පැතිර නොමැති හෝ කොහෙත්ම නැති ප්‍රදේශවලින් හෝ පැමිණි අය වන බැවින් ඔවුන්ගේ ප්‍රතිශෝධන ශක්තිය ඉතා හීනවීම හේතු කොට ගෙන ඔවුන්ට මැලේරියා රෝගය වැළඳුනහොත් ප්‍රදේශ වාසීන්ට වඩා දරුණු ලෙස රෝගයට ගොදුරු වනු ඇත. මදුරු වාගේ රුධිර අන්නය සැපයූ සිවුපාවුන් එම ප්‍රදේශවලින් පළායාම නිසා උන් සිය පැවැත්ම සඳහා රුධිර අන්නය මිනිසුන්ගෙන් ලබා ගනී.

මෙමගින් මැලේරියා රෝග සම්ප්‍රේෂණය තවත් උග්‍රවේ. අප රට මෙම රෝගයේ පැවැත්ම කෘත්‍රිම ස්වරූපයක් ගනී. මෙබඳු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් මගින් මෙම ප්‍රදේශවල ප්‍රතිග්‍රහ කත්වය හා රෝගය වැළඳීමට ඇති හැකියාව තීව්‍ර වී ඇති අතර, මැලේරියා රෝගය පැතිරීමට ඇති විභවතාවය බොහෝ සෙයින් වැඩිවී ඇත.

මැලේරියා රෝගය පැතිරීමට ඇති ඉඩකඩ වැඩිවීම නිසා එබඳු සංවර්ධන යෝජනාක්‍රම ආරම්භ නොකළ යුතුයයි පැවසිය නොහැක. අපගේ මූලික පරමාර්ථය වනුයේ එබඳු යෝජනාක්‍රම ආරම්භකිරීමට පෙර මෙම ප්‍රදේශවල කාලීන පියවර ගතයුතු බව දක්වීමය. මෙම පරමාර්ථය මුදුන්පත් කර ගැනීම සඳහා මැලේරියා මර්ධන ව්‍යාපාරය මෙම යෝජනාක්‍රම සැලසුම්කරන අවධියේදී සිට ඒ හා සම්බන්ධව කටයුතු කිරීම අත්‍යවශ්‍යය.

ශ්‍රී ලංකාවේ මැලේරියා රෝගය ප්‍රචලිත ප්‍රදේශ සඳහා පස් අවුරුදු ප්‍රකර්ශ මැලේරියා මර්ධන වැඩ සටහනක් 1977 ඔක්තෝබර් පමණදී ආරම්භ කරන ලදී. කඩිනම් මහවැලි වැඩ සටහන යටතේ ඇති සියලුම ප්‍රදේශ මෙයට අයත් වේ. මෙම වැඩ සටහනෙහි ප්‍රධාන අරමුණු වූයේ:—

(1) මැලේරියා රෝගය ප්‍රධාන මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් වශයෙන් තවදුරටත් නොපවතින ලෙස අවුරුදු පහ අවසානයේදී එහි පැතිරීම ඉතාමත් පහත් මට්ටමකට ගෙන ඒම, සහ

(2) මීළඟ පස් වසර ඇතුලතදී සෝපද්‍රව මැලේරියා රෝගය සාර්ථක ලෙස මර්ධනය කිරීම.

**වැඩසටහනේ මූලික කටයුතු:—**

(i) **සාවශේෂ ඉසීම:—**

මැලේරියාව ගහණ ප්‍රදේශවල නිවාස හා පිටගෙවල් දශ ලක්ෂයකට මාස තුනකට වරක් මැලතියොන් (වර්ග මීටරයකට ග්‍රෑම් 2) ඉසීම.

(ii) **ඖෂධ ප්‍රතිකාර:—**

(අ) මැලේරියාව වැලඳී ඇති බවට රෝග නිශ්චය කර ඇතිවූ අයට හා මැලේරියාව වැළඳී ඇති බවට සැකකරනු ලබන සියළුම අයට, රජයේ වෛද්‍ය ආයතන, මැලේරියා මර්ධන ව්‍යාපාරයේ සේවක පිරිස් හා දුරබැහැර ප්‍රදේශවල විශේෂ පුහුණුව ලත් ස්වේච්ඡා සේවක පිරිස් විසින්ද දින 5 ක මූලික ප්‍රතිකාර කරනු ලැබේ.

(ආ) මැලේරියාව ගහණ ප්‍රදේශවල සංවර්ධන ව්‍යාපාර වලට අනුයුක්ත නිලධාරීන්ට හා සේවකයන්ට මෙන්ම තාවකාලික පදනමක් මත මැලේරියා රෝගය නැති ප්‍රදේශවලින් රෝගය ප්‍රචලිතව පවත්නා ප්‍රදේශවලට පිවිසෙන පුද්ගලයන්ට රෝග නිවාරණ ප්‍රතිකාර ලබා දෙනු ඇත.

(iii) **රෝග නිවාරණය:—**

විශේෂ දර්ශක ආයතන, සක්‍රිය කළ වෛද්‍ය ආයතන හා නිරත රෝග නිරාවරණ නියෝජිතවරුන් 36 ක් මැලේරියා රෝග නිරාවරණ කටයුතුවල යෙදී ඇත.

(iv) **කීට විද්‍යාත්මක විමර්ශන:—**

කීට විද්‍යාත්මක කණ්ඩායම් 12 ක් මෙරට මැලේරියා ව ගහණ ප්‍රදේශවල විමර්ෂන පැවැත්වූහ. ක්ෂේත්‍ර තත්ත්ව යටතේ මැලතියොන් කෘමිනාශකයෙහි කාර්යක්ෂමතාවය, කෘමිනාශක ද්‍රව්‍ය ඉසීමෙන් වාහක ජන ගහණය කෙරෙහි ඇතිවන බලපෑම හා වාහක ජනගහණ යෙහි දක්නට ඇති චර්යා වෙනස්කම් ආදිය මෙම අධ්‍යයන වල අන්තර්ගත විය.

(v) **ප්‍රවර්ධනය කරනු ලබන වෙනත් මර්ධන ක්‍රම:—**

(අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය, මහවැලි සංවර්-ධන මණ්ඩලය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේද

සහයෝගය ඇතිව වාහක-බෝවීම නවතාලීම සඳහා දිය පාරවල් හා වාරිමාර්ග දිය ඇලි විටින්විට සෝදා හැරීම.

(ආ) සමාජ සේවා දෙපාර්තමේන්තුව, මහාමාර්ග දෙපාර්තමේන්තුව හා මැණික් සංස්ථාවේ සහයෝගය ඇතිව කෘත්‍රිම වාහක අභිජනක ස්ථාන ඇතිකිරීම වැළැක්වීම.

(ඇ) කීට භක්ෂක මසුන් යොදාගැනීම බඳු වූ ජෛව වේදීය මර්ධන ක්‍රම.

(ඈ) ඇබේට් බඳු කීටනාශක රසායනික ද්‍රව්‍ය පාවිච්චිය.

(vi) අභ්‍යාස හා සෞඛ්‍ය අධ්‍යාපනය:—

මැලේරියා අභ්‍යාස මධ්‍යස්ථානය වූ කලී මැලේරියා මර්ධන ව්‍යාපාරය, වෛද්‍ය හා අනුවෛද්‍ය සේවක පිරිස්, වෙනත් රජයේ දෙපාර්තමේන්තුවල සේවක පිරිස් හා ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය සේවකයන් සඳහා අභ්‍යාස වැඩ සටහන්වල කේන්ද්‍රස්ථානය වේ. මැලේරියා මර්ධන ව්‍යාපාරයේ සහයෝගිතාවයද ඇතිව සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය මගින් ප්‍රජාව සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරවනු ලැබේ.

(vii) පර්යේෂණ හා ක්ෂේත්‍ර පිරික්සුම:—

උද්ගතවිය හැකි තාක්ෂණික හා මෙහෙයුම් ගැටළු මගහරවා ගැනීමට හා ප්‍රවර්තන මර්ධන ක්‍රම පරිපූරණය කිරීම සඳහා යොදාගත හැකි නව ක්‍රම ප්‍රවර්ධනය කර ගැනීමද උදෙසා මැලේරියා මර්ධන ව්‍යාපාරය මගින් පර්යේෂණ හා ක්ෂේත්‍ර පිරික්සුම් පවත්වනු ලැබේ.

මැලතියොන් කෘමිනාශකය තුන් වතාවක් ඉසීමෙන් පසුව දැනටමත් මැලේරියා රෝගය බොහෝසෙයින් අඩුවී ඇති අතර, සෝපද්‍රව මැලේරියාව පුදුම උපදවන ලෙස පහත වැටී ඇත. මෙය කලාවැව ප්‍රදේශයේ (එච් කලාපයෙහි) හා කඩිනම් වැඩසටහන යටතේ මුලහට සංවර්ධනය කළ යුතුව ඇති ඒ, බී, හා සී, කලාප වලද මෙය පැහැදිලිවම දක්නට ඇත. සනාථක කරුණු ලබා ගන්නා ලද්දේ රෝහල්වල සංඛ්‍යා ලේඛනවලින් හා මෙම ප්‍රදේශ වල මැලේරියා මර්ධන ව්‍යාපාරයේ නිලධාරීන් විසින් පවත්වන ලද විශේෂ මහජන සමීක්ෂණ හා ක්ෂේත්‍ර සමීක්ෂණ ආශ්‍රයෙනි.

කෙසේවුවද, මෙම සංවර්ධන ව්‍යාපාර ප්‍රකර්ෂ කිරීමත් සමගම කලින් විස්තර කර ඇති අයුරු මැලේරියා රෝගය පැතිරීමට ඉඩ ඇත. විස්තර කර ඇති කටයුතු, සංවර්ධනය කරනු ලබන ප්‍රදේශ වල වඩා ප්‍රකර්ෂවත් අන්දමින් ක්‍රියාත්මක කළ යුතුය. නිවාස හා වාඩිවල පදිංචියට පෙර හා පසුව මැලතියොන් ඉසීම, ජනාවාසීන් හා මණ්ඩලයේ සේවක පිරිස්වලට රෝග නිවාරණ ප්‍රතිකාර ලබාදීමද අත්‍යාවශ්‍යය.

මැලේරියා මර්ධන ව්‍යාපාරය යෝජනා ක්‍රමයේ සැලසුම් අවධියේ පටන් එහි අවසාන අවධිය දක්වාම මහවැලි සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාශීලී සහභාගිවන්නකු ලෙස කටයුතු කළ යුතු බව අවධාරණය කළ යුතුය. කටයුතු කඩිනම් කිරීම හා අවුරුදු 30 ක කාලයක් ඇතුලත කළයුතු කාරිය අවුරුදු සයකට සංකෝචනය කර ඇති බැවින්ද, කඩිනම් ව්‍යාපාර ප්‍රදේශයේ කටයුතු කරගනයාම සඳහා මැලේරියා මර්ධන ව්‍යාපාරයට කෘමිනාශක බෙහෙත්, සේවක පිරිස්, උපකරණ හා ප්‍රවාහණ පහසුකම් තවත් වැඩියෙන් ලබාදිය යුතුය. මෙම අතිරේක අවශ්‍යතා පිළිබඳ ව්‍යාපෘති වාර්තා දැනටමත් ඉදිරිපත් කර ඇත.

ජල පාලනය හා ජලය මෙහෙයවීම බඳුවූ අනිකුත් කටයුතුද වැදගත් ලෙස සැලකිය යුතුය. 1976 වර්ෂයෙහි පොල්ගොල්ලේදී මහවැලි ගඟ හැරවීමෙන් පසුව, ස්වාභාවික යටගෙහි භාරගම් දක්වා නියං කාලයේදී දියකඩිති සෑදුණෙන් මැලේරියා නොතිබි ප්‍රදේශවල උන්හිටි හැටියේම රෝගය පැතිරිණි. මහවැලි මණ්ඩලයේ සහයෝගය ඇතිව සතියකට වරක් පැය 3-4 දක්වා ජලය කියුසෙක් 2000 ක් නිකුත් කර ගඟ සෝදා හැරීමෙන් මෙම තත්ත්වය මගහරවා ගන්නා ලදී. මෙය දැන් නියං කාලයේදී පොල්ගොල් ලෙහි නිතිපතා සිදුකරනු ලබන කාර්යයකි. මෙම ක්‍රමය ක්‍රියාත්මක කළහැකි කඩිනම් සංවර්ධන ප්‍රදේශයේ අනෙකුත් ප්‍රදේශවලද අනුගමනය කළහැක. සංවර්ධන ප්‍රදේශවල මැලේරියා මර්ධනය සඳහා වාරිමාර්ග ඇලවල් නිසි පරිදි නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීමද ඒවායේ දියකඩිති ඇතිවීමට ඉඩ නොහැරීමද පූර්ව අවශ්‍යතාවයන්ය. මෙහිදිද මැලේරියා මර්ධන ව්‍යාපාරය මහවැලි මණ්ඩලය සමග සමීප සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කළ යුතුය.

ඇතැම් නිලධාරීන් හා සේවකයන් කිහිපදෙනෙක් සිය නිවෙස්වල බෙහෙත් ඉසීම නොකරන බව හා රෝග නිවාරණ ප්‍රතිකාර නොගන්නා බවද කණස්සල්ලට කරුණකි.

මැලේරියා මර්ධන ව්‍යාපාරය ප්‍රකර්ෂවත් ලෙස ක්‍රියාත්මක වන බැවින් මෙම ප්‍රදේශවල දැනට මැලේරියා රෝගය පැතිරීම බෙහෙවින් අඩුවුවද, මෙම සේවක පිරිස් රෝග නිවාරණ ප්‍රතිකාර නොගන්නා බැවින් රෝගය බහුලව පැතිරෙන සමයේදී මොවුන් රෝගයට ගොදුරුවීම නිසැකයෙන්ම සිදුවන්නකි. සිය නිවෙස් වලට බෙහෙත් ඉසවා ගැනීමට හා සතිපතා රෝග නිවාරණ බෙහෙත් ගැනීමද සඳහා ඇති පරම අවශ්‍යතාවය පිළිබඳව මෙම නිලධාරීන් හා සේවකයන් උද්‍යොගිමත් කරවීම සඳහා මේ ප්‍රදේශවල විශේෂ චිත්‍රපට දර්ශන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ද පැවැත්වේ. මැලේරියා රෝගය වැළඳුනවිටදී සෞඛ්‍ය සේවා මගින් තමන්ට ප්‍රමාණවත් ආරක්ෂාව නොසලසන ලදැයි මොවුන් පැවසීම වක්‍රෝක්තියකි.

ප්‍රදේශයේ සියළුම වෛද්‍ය ආයතනවලදී හා ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ හා මහවැලි මණ්ඩලයේ වෙනත් නිලධාරීන්ගේද සහාය ඇති ජනාවාසවලින් තෝරාගත් ස්වේච්ඡා සේවකයන්ගෙන් යුක්ත ස්වේච්ඡා ප්‍රතිකාර මධ්‍යස්ථානවලදීද මැලේරියා රෝගයට ප්‍රතිකාර කරනු ලැබේ.

සේවකයන්ට හා ජනාවාසීන්ට ඔවුන්ගේ නිවෙස්වලට බෙහෙත් ඉස්වා ගැනීමට හා රෝග නිවාරණ බෙහෙත් ගැනීමට ඇති අවශ්‍යතාවය අවබෝධ කරවීම සඳහා සමාජයේ පහලම මට්ටමේදී සම්මන්ත්‍රණ හා සමූහ සාකච්ඡා පැවැත්වීමට මැලේරියා මර්ධන ව්‍යාපාරය සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය සමග උනන්දුවකින් යුතුව කටයුතු කරයි.

මැලේරියා රෝගය එතරම් දරුණු ලෙස නොව සාමාන්‍ය වශයෙන් වැළඳුන විටදී පවා, සේවකයන්ට මිනිස් දින 5 ක් අහිමි වියහැකි බව සටහන් කරගැනීම වැදගත්ය. රෝගය ආකූල වුව හොත් හෝ දරුණු ලෙස රෝගාතුරවීම හෝ සිදුවුවහොත් මීට වඩා වැඩි දින ගණනක් අහිමි විය හැකි අතර, වැඩ ඉලක්ක මුදුන්පත් කරගැනීමට අපහසු වනු ඇත.

කඩිනම් මහවැලි යෝජනා ක්‍රම ප්‍රදේශයේ මැලේරියා මර්ධන කටයුතු ප්‍රකර්ෂවත් කිරීම සඳහා මුදල්, භාණ්ඩ හා සේවා සැපයුම් හා ප්‍රවාහණ සේවා මෙන්ම නිලධාරීන්, සේවකයන් හා ජනාවාසීන් ගේද පූර්ණ සහයෝගය ලබාදුනහොත් මෙම යෝධ සංවර්ධන ව්‍යාපාරයට මැලේරියා රෝගයෙන් බාධා ඇතිවේ යයි විශ්වාස කිරීමට කිසිදු හේතුවක් නැත.

# මහවැලි ව්‍යාපාරය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටළු සමහරක්

**තිස්ස විතාරණ**

**වෛද්‍ය පර්යේෂන ආයතනය**

අද අපි සෞඛ්‍ය පිළිබඳව කථාකිරීමේදී අසනීපයෙන් තොරව සිටීමේ ප්‍රතිශෝධාත්මක අදහසින් පමණක් නොව, ප්‍රශස්ත මානසික හා ශාරීරික සෞඛ්‍යය පිළිබඳ සක්‍රිය අදහසින්ද කථා කරමු. ශ්‍රී ලංකාවේ අපි දනුදු මෙයින් පළමුව සඳහන් කාර්යය පිළිබඳව පමණක් ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වෙමු. මහවැලි යෝජනාක්‍රම ප්‍රදේශය මූලික සෞඛ්‍ය සේවා ඇතුළුව, සුවකිරීමේ හා නිවාරක සෞඛ්‍ය පහසුකම් අතිශයින්ම විරල බව මෙහිදී පැවසිය හැක. වෛද්‍යාචාර්ය පර්සි ද සිල්වා මහතාගේ සමීක්ෂණ යට විෂයවූ පවුල් 1000 ට ප්‍රවීණතාවය ඇති එකද සෞඛ්‍ය සේවය කුවත් නොමැතිබව පෙනී යයි.

මෙම තත්ත්වය යටතේ මෙහි දැනටමත් පදිංචිව සිටින ජනතාවට ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් සැලසීම සඳහා තවත් බොහෝ දෑ කළ යුතුව ඇත. එනමුදු ඉන් බොහෝ දෙනෙකු විස්ථාපනයවීමත්, ඔවුන්ගේ ජීවන ක්‍රම භේදනය වීමත් නිසා (පුරාණ ගම්වාසීන්ගේ ජීවන ක්‍රමය ඈත අතීතයේ පටන් පැවතුනකි) සෑම වර්ගයකම සෞඛ්‍ය ප්‍රශ්න විශේෂයෙන්ම මනෝ චිකිත්සක විකෘතීන් වැඩිවීම අපේක්ෂා කළ හැක.

මේ ප්‍රදේශයට පළමුව ඉදිකිරීම් වැඩවල නියුතු සේවකයන් හා යථාකාලයේදී ජනාවාසීන්ද රාශිවශයෙන් පිවිසෙනු ඇත. එබැවින් සෞඛ්‍ය කාර්යයෙහි ක්ෂණික වර්ධනයක් ඇතිවීම අපේක්ෂා කළ හැකිය.

ලබාගත හැකි සීමිත දත්තයන්ගෙන් මෙම සෞඛ්‍ය කාර්ය ස්වභාවය නිගමනය කරගත හැකිවුවද පහසුව තකා මෙය (අ) ප්‍රවර්තන රෝග රටා වර්ධනය සහ (ආ) ඉදිරියේදී ඇතිවිය හැකි නව රෝග යනුවෙන්ද බෙදා වෙන් කළ හැක.

**(අ) ප්‍රවර්තන රෝග රටාවෙහි වර්ධනය:—**

නිසි සමීක්ෂණ පවත්වා නැති බැවින් ලබාගත හැකි දත්ත සතුටු දයක නොවූවද රෝහල්වල සංඛ්‍යාලේඛන පදනම් කොට ඇති බැවින් ප්‍රදේශයේ රෝග පැවැත්ම පිළිබඳ යම්කිසි හැඟීමක් එමගින් ලබාගත හැක. මැලේරියා රෝගය නිසැකයෙන්ම ප්‍රධාන ගැටළුවක් වුවද ආමාශ රෝග ඒ හා සමාන හෝ ඊටත් වඩා වැඩි වැදගත්කමකින් යුතුවන බව පෙනේ. මන්දපෝෂණය හා රක්ත හීනතාවය, පණුරෝග හා වයිරස හා බැක්ටීරියා රෝගද සැලකිය යුතු තවත් සෞඛ්‍ය ප්‍රශ්න ලෙස දැක්විය හැකිය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය මුණසිංහ මහතා විසින් ''කලාඔය ව්‍යාපාරයේ යෝජිත සෞඛ්‍ය සේවා පහසුකම්'' යන මැයෙන් යුතු ලේඛනයේ පහත සඳහන් කරුණු අවධානයට ලක්කර ඇත.

''ප්‍රදේශයේ ග්ලානත්‍ය රටාව අනුව මැලේරියා හා ආමාශ රෝග බරපතල සෞඛ්‍ය ගැටළු ලෙස පෙනීයයි. පසුගිය අවුරුදු වලදී මෙම රෝගවල පැවැත්ම වැඩිවී ඇති අතර මැලේරියාව ඒක ප්‍රදේශික රෝගයකි. නව ඇලමාර්ග හා ජලාශ ජාලයක් ඇතිකිරී මෙන් පසුව නොගැඹුරු දියකඩිත්ති සුලභ විය හැකි වන අතර මේවා හි මැලේරියා මදුරුවන් බෝවීම සිදුවිය හැක. කැලිකසළ ඉවත්කිරීමේ නිසි ක්‍රමයක් නොවුවහොත් ඇලමාර්ග හා ජලාශ යන්ද දූෂිතවීමට ඉඩ ඇත. මෙබඳු සෞඛ්‍ය උවදුරු, වැඩිවෙන ජනගහණය හා අප්‍රමාණවත් සෞඛ්‍ය සේවා පහසුකම් හේතුකොට ගෙන සංවර්ධන වැඩසටහන විනාශවීමට ඉඩ ඇත.''

මෙම ගැටළු ප්‍රධාන වශයෙන්ම නිරාකරණය කරගත හැකි වනුයේ ඒවා වැළැක්වීමෙනි. යෝග්‍ය නිවාස හා සෞඛ්‍යාරක්ෂණය හා කැලිකසළ ඉවත්කිරීමේ ක්‍රම හා සුරක්ෂිත ජල සැපයුම් ලබාදීම මෙම ක්‍රියාමාර්ගයේ පදනම වනු ඇත. මීට අමතරව රෝග හට ගැනීම හා රෝග නිවාරණය පිළිබඳව මහජනයාට අවබෝධ කරවීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක්ද සිටිය යුතුය. මෙම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරවීමට නම් ඒවා මහවැලි යෝජනාක්‍රමයේ සැලසුම් අදියරෙහිදීම සලකා බැලිය යුතුයි. යෝජනා ක්‍රමය මිනිසුන්ට සේවයක් සැලසීම සඳහා වන බැවින් නිරෝගී ජනතාවක් නොසිටිය හොත් යෝජනාක්‍රමය අසාර්ථක වීමට පවා ඉඩ ඇත.

මහවැලි සංවර්ධන මණ්ඩලයේ වෛද්‍යාචාර්ය අබේගුණ-වර්ධන මහතාගෙන් විමසා ලබාගත් කරුණු අනුව, මණ්ඩලය මගින් නිවාස සපයනු නොලබන බවද නිදර්ශක සැලැස්මක් නොවන බවද පෙනේ. සෑම ජනාවාසියෙකුටම තමන්ට රිසි පරිදි සිය නිවෙසි ඉදිකර ගැනීමට නිදහස ඇත. මණ්ඩලය විසින් සෑම ජනාවාසි යෙකුටම වැසිකිළියක් තනාගැනීමට නොමිලේ උක්කුටික තැටියක් හා රු. 60/- ක මුදලක් ලබාදෙනු ඇත. මුදල් අගහිඟකම් ඇති, නිසි සනීපාරක්ෂාව පිළිබඳ අවබෝධයක් නොමැති ජනාවාසීන් මේ සම්බන්ධයෙන් මුදල් හා ශ්‍රමය වැයකරයිද යන්න සැක සහිතය. ජනාවාසීන්ට වෙනත් ප්‍රමුඛතාවන් ඇත. උදාහරණ වශයෙන් වෙනත් ජනපද ව්‍යාපාරවලදී රජය මගින් සපයනු ලැබූ වැසිකිළි දර ගබඩා කිරීම සඳහා පාවිච්චියට ගෙන ඇත. ජලය සැපයුම පිළිබඳ ප්‍රශ්නයද තවමත් නිරවුල් කර නැත. ළිං තැනීම සඳහා අවශ්‍ය මුදල් ජාත්‍යන්තර ඒජන්සියකින් ලබාගැනීමට නියමිතය. එහෙත්, අතීතයේදී මෙන් ගෙවල් 10 ක හෝ 20 ක සමූහයකට එක් ළිඳක් හෝ එක් එක් නිවෙසක් සඳහා වෙන වෙනම ළිඳක් බැගින් තිබිය යුතුද යන්න තීරණය කර නැත. නිසි කසළ ඉවත් කිරීමේ ක්‍රම, හා පසෙහි සවිවරතාව, ජලය ගලාබැසීම, පස හා දිය පාරවල් අපවිත්‍රවීම ආදී වශයෙන් ප්‍රශ්නය සමස්ත වශයෙන් සැලකිල්ලට භාජනය නොකළහොත් ගෙයක් ගෙයක් පාසා ළිං තැනීමෙන් වුවද ජලය අපවිත්‍ර වීමට ඉඩ ඇත.

තව තවත් ආයතන සේවා පිරිස්, ඖෂධ හා වාහන ආදිය සපයාදීමෙන් සුවකිරීමේ සේවා ව්‍යාප්තිකිරීම සඳහා ඇති අවශ්‍ය තාවය වෛද්‍යාචාර්ය මුණසිංහ මහතාගේ වාර්තාවෙන් අවධානයට ලක්කොට ඇත. මේවා සියල්ල සැපයීම සඳහා අවුරුදු කිහිපයක්ම ගතවීමට ඉඩ ඇති අතර මේ අතරතුරදී ප්‍රදේශයෙන්ම මෙන්ම බැහැරින් ස්වේච්ඡා සේවක පිරිස් බඳවාගැනීමට ඇති හැකියාවද ගවේෂණය කළ යුතුය.

### (ඈ) නව රෝග ගැටළු:—

වෘත්තීය රෝග ප්‍රධාන ගැටළුවක් වශයෙන් ඉස්මතුවීමට ඉඩ ඇත. ඉදිකිරීමේ කටයුතු හා කෘෂිකර්මාන්තය යාන්ත්‍රිකරණය කිරීමද අශ්‍රයෙන් හදිසි අනතුරු සිදුවීම අපේක්ෂා කළ හැකිය. පළිබෝධ නාශක ද්‍රව්‍ය භාවිතයෙන් විශේෂයෙන්ම නව පදිංචිකරුවන් අතර රසායනික විෂගත වීමේ උවදුර ඇතිවිය හැකිය. මෙම රසායනික ද්‍රව්‍ය භාවිතාකිරීම පිළිබඳව ඔවුන්ට උපදෙස් දීම හා ආරක්ෂිත ඇඳුම් පරිහරණය සඳහා අනුබල දීමද කළ යුතුය. ඇට්‍රොපිනා පෙති සැපයීම හා එය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් උපදෙස් නිකුත්කිරීමද සලකා බැලිය යුතුය. වැරදීමකින් විෂ ශරීර ගතවීම හැකිතරම් දුරට වළකාලීම සඳහා පළිබෝධ නාශක බෙහෙත් අඩංගු ඇසුරුම් නිසියාකාරව සලකුණු කරතිබීම අත්‍යාවශ්‍යය.

දැනට පදිංචිව සිටින ජනවාසීන්ගේ විස්ථාපනය, ගතානුගතික ජීවන රටාවේ වෙනසියාව හා නව පදිංචිකරුවන් සමායෝජනය කිරීම පිළිබඳ ගැටළු ආදිය හේතුකොටගෙන නොයෙකුත් මාදිලියේ මනෝ චිකිත්සක ගැටළු හටගැනීමට ඉඩ ඇත. පුද්ගලික මට්ටමේදී මෙන්ම සාමූහික හා ප්‍රජා මට්ටමෙහිදීද මීට පිළියම් කළ හැකිය.

කැලෑ ප්‍රදේශ එළිකිරීමෙන් සර්පයන් දෂ්ඨ කිරීම, මැලේරියාව හා ලෙප්ටොස්පයිරොසියාව බඳුවූ උවදුරු හැරුනු කළ සතුන්ගෙන් හා කෘමීන්ගෙන් අලුත් රෝග බෝවීමද සිදුවිය හැකිය. දකුණු ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයෙහි ප්‍රචලිතවූ ක්යෙසානූර් කැලෑ රෝගය හේතු වයිරසයක් වශයෙන් හඳුනාගැනීමට පෙර උණ සන්නිපාතය, රක්තපාතික උණ, මැලේරියාව හා කහ උණ ලෙස සලකන ලදී. වෙව්ලීම සහිත සෑම උණ රෝගයක්ම මැලේරියා ලෙස සැලකීම අඥාණය. ප්‍රමාණවත් රසායනාගාර හා පර්යේෂණ සේවාවල අනුබලය ඇතිව මෙබඳු රෝග පිළිබඳ නිසි විමර්ශන පැවැත්වීම අත්‍යවශ්‍යය.

### (ඇ) ක්‍රියාමාර්ගය:—

ගතයුතු ක්‍රියාමාර්ගය යථෝක්ත කරුණුවලින් පැහැදිලි වුවද, පහතින් දක්වා ඇති කරුණු අවධාරණයෙන් දැක්විය යුතුය. (1) අනුරාධපුර මහ රෝහල කේන්ද්‍රස්ථාන කොටගත් කාර්යක්ෂම හදිසි අනතුරු සේවාවක් ඇතිකළ යුතුවන අතර, ප්‍රමාණවත් ශල්‍ය වෛද්‍යවරු හා විකලාංග ශෝධක ශල්‍ය වෛද්‍යවරයකුද ඊට අනුයුක්ත කළ යුතුය. මේ සඳහා ප්‍රමාණවත් ගිලන් රථ සේවාවක්ද සැපයිය යුතුවේ. (2) අනුරාධපුරයට මනෝ චිකිත්සක වෛද්‍යවරයකු හෝ වෛද්‍යවරු කිහිපදෙනෙකු හෝ පත්කළ යුතුවන අතර ඔවුහු දිස්ත්‍රික්ක හා පර්යන්ත රෝහල්වල චිකිත්සාගාර පැවැත්විය යුතුය. (3) අනුරාධපුර මහ රෝහලෙහි රසායනාගාරය අංග සම්පූර්ණ එකක් බවට පත්කොට බැක්ටීරියා විද්‍යාව පිළිබඳ පුහුණුව ලත් ව්‍යාධිවේද විද්‍යාඥයකු හෝ අතිරේක ව්‍යාධිවේද විද්‍යාඥයකු හෝ ඊට අනුයුක්ත කළ යුතුය. ව්‍යාධිවේද විද්‍යාඥයකුට වසංගතවේදත්මක අංශයෙහිලා සහාය විය හැකි වුවද, පූර්ණකාලීන වසංගත විද්‍යාඥයකු පත්කිරීම වඩා නුවණට හුරුවේ. මෙම ඒකකය විසින් පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ හා විශ්ව විද්‍යාලවල සහායද ලැබගත හැක. (4) තත්ත්වය හසුරුවීමට හා පාලන ක්‍රියාමාර්ග යොදගැනීමද සඳහා මෙම විෂය පිළිබඳව උනන්දුවක් දක්වන කොළඹ වෛද්‍ය පීඨය බඳු ආයතනද ඇතුලත් කළ හැකි විෂ පිළිබඳ විශේෂිත අංශයක්ද පිහිටුවිය යුතුය.

මහවැලි ව්‍යාපාරය සඳහා නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයකු වෙනමම පත්කිරීමද කදිම අදහසකි. එමගින් රෙගුලාසි බාධා බොහොමයකින් මිදී, සැලසුම් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමද කළ හැකිය.